මුතුමුදලිගේ නිශ්ශංකගේ
තවත් සිනමාමය නිර්මාණයක්

මේ අත කාගෙද?

ප්‍රථම මුද්‍රණය : 2023 ජූලි

දෙවන මුද්‍රණය : 2025 ජනවාරී

ISBN 978-624-5552-05-4

මුද්‍රණය -

එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්

නො 27/18 ජයන්ත වීරසේකර මාවත,

කොළඹ 10

සෝදුපත් පරීක්ෂාව - අශෝක කුලතුංග

කවර නිර්මාණය - කලන ගංගනාත්

පරිසනක පිටු සැකසුම - කාවින්ද්‍යා රත්නායක

ප්‍රකාශනය

පොත්මී ප්‍රකාශන,

මුතුමුදලිගේ හෝල්ඩින්ග්ස් පුද්ගලික සමාගම,

කොළඹ 13

මෙම පොතෙහි සියලුම හිමිකම් ඇවිරිණි. කර්තෘගේ අවසරය නිසි පරිදි ලිපියකින් නොලබා මෙහි එන කිසිවක්ම, මොනම ආකාරයකින්වත් නැවත පළ කිරීම තහනම් වේ. එම තහනමට: අතින්, යාන්ත්‍රිකව හෝ විද්‍යුත් ක්‍රමයකින් පිටපත් කිරීම, වීඩියෝ හෝ ඕඩියෝ ලෙස නිර්මාණය කිරීම,

ඊ -බුක්, පිඩීඑෆ් ලෙස හෝ වෙබ් අඩවිවල පළ කිරීමද ඇතුළත් බව සලකන්න.

සියලුම හිමිකම් ඇවිරිණි.

මුතුමුදලිගේ නිශ්ශංක 2023

පිදුම

මඩ ගැසූ පමණින්
මුතුමුදලිගේ නිශ්ශංකව
ක්ෂේත්‍රයෙන් විසිකළ හැකිවනු ඇතැයි
සිතූ සැමට
අනුකම්පාවෙන්!

පෙර කියවීම

හරිඳු උඩපිටිය
උත්පලා වනිගරත්න
චාරක බණ්ඩාර ගොඩකුඹුර
චතුමි අලහකෝන්
ඉෂාරා ජයසිංහ

Copyright © 2023 Muthumudalige Nissanka

All rights reserved. No part of this publication may be reproduced, distributed, or transmitted in any form or by any means, including photocopying, recording, or other electronic or mechanical methods, without the prior written permission of the publisher, except in the case of brief quotations embodied in critical reviews and certain other noncommercial uses permitted by copyright law. For permission requests, write to the publisher.

PothMee Publication
Web: www.pothmee.com
Hotline: 0776882324

වර්ෂය - **2020**

එස්ටෝනියාව

එන්න අපි එස්ටෝනියාවට යමු!

මේ කතාව පටන් ගන්නේ එස්ටෝනියාවේ පැරණිතම නගරයක් වන "කෙයිලා" වලින්. මේ නගරයේ ඉතිහාසය ක්‍රිස්තු පූර්ව දහයකටත් එහා දිව යන්නක්. ඒ කියන්නේ ක්‍රිස්තුස් වහන්සේ ඉපදෙන්නත් කලින් හදාපු දේවස්ථානවල නටබුන් පවා මෙම නගරය තුළ දී ඔබට දැකගන්න පුළුවන්. එහෙත් මෙය කුඩා නගරයක් නොවෙයි; මිනිසුන් දස දහසකට අධික ප්‍රමාණයක් ජීවත්වන මඳක් විශාල නමුත් අනිකුත් එස්ටෝනියානු නගරවලට වඩා ඓතිහාසික වටිනාකමින් යුත් නගරයක්.

හරි අපි දැන් කතාව පටන් ගමු.

1

ශීතල හිම වැටෙන රාත්‍රියක ඔබ කෙයිලා නගරයේ ඇවිද ගොස් තිබෙනවා ද? එසේනම් එය එතරම් ම මනරම් චමත්කාරජනක රාත්‍රියක් වේවි.

සුදු පාට පුළුන් වැනි හිම පොකුරු එක පිට එක පොරකමින් ආකාශයෙන් ඇද වැටෙමින් ඔබ ඇඳ සිටින ඝන ලෝම කබායට ඇද වැටෙන සැටි මොහොතකට සිතන්න. එම හිම පියලිවල සීතල ඔබේ ශරීරය ස්පර්ශ කරද්දි ඒවා ඔබේ ස්නායූ තන්තුවලට පවා දැනේවි. එම ශීතල, තන්තු තුළට ගිලා බැස හදවතේ සිහින් දාරයන් පවා ශීත කරාවි. ඔබ හිස ලා සිටින්නේ හමින් කළ කැප් තොප්පියක් නම්, හිම පියලි ඒවා මතින් දියවී බිමට වැටෙද්දි ශීතල සුළඟත් සමඟ එහි ජල වාෂ්ප ඔබේ මුහුණටත් වදීවි. ඔබ නාසය ආවරණය කර නොසිටියහොත් නිසැකව ම එම ශීතල මොළයට කිඳා බැස ඔබේ හිස වේදනාවට පත් කරනු ඇත. මේ ආකාරයෙන් ඔබ ඉදිරියට ම ගමන් ගනිද්දි ආකාශයේ සිට කඩා වැටෙන හිම පියලි ක්‍රමයෙන් වැඩි වේවි. එවිට මාවත්වල අටවා ඇති ස්වේත වර්ණ විදුලි ලාම්පු එළියෙන් ඒවා අමුතු ම ආකාරයේ රටා මවනු ඇත. ඈතින් හමා එන සුළඟේ මිමුනුමත් එම රටාවනුත් එකතුව හිම පියලි ඔබ දෑස් ඉදිරියේ සුළඟේ මියුරු සංගීතයට වසඟ ව නැටුමක් නටන්නේ යැයි ඔබට සිතෙනු නොඅනුමාන ය.

මෙයත් එවන් රාත්‍රියකි.

ඔහුට ද මා කියූ ඒ දේවල් ඒ ආකාරයෙන් ම දැනිණ. ඔහු පැලඳ සිටි කළු පැහැ කැප් තොප්පියට වැටුණු හිම කැට ඒවා මතින් දියවී පහතට වැටෙද්දි සුළඟත් සමඟ ම ඒවායේ වාෂ්ප ඔහුගේ මුහුණට වැදිණ. එහි සීතල ඔහුගේ නාසයෙන් ඇතුල් වී මොළය දක්වා ගලා ගියේ ය. ඔහු ඇඟලා සිටි ඝන පොලිස් කබායට වැටුණු හිම කැට ශරීරය ස්පර්ශ කරද්දි එයින් නැගුණු ශීතලින් ඔහුගෙ හදවත කිලිපොළා යන්නට විය.

එහෙත් මෙම රාත්‍රිය ඔහුට ඔබ සිතන ආකාරයෙන් චමත්කාරජනක රාත්‍රියක් වූයේ නම් නැත.

මීට හෝරාවකට පෙර ඔහු තම පොලිස් කාරයේ උණුසුමට ගුළිවී රාජකාරී අවසන් වී නිවසට යෑමට වේලාව එන තෙක් බලාගෙන සිටියේ ය. නිවසට යා හැකි වේලාව විනාඩි තිහටත් ළඟාවෙත් ම ඔහුගේ සිතට ආයේ වඩාත් උණුසුම් හැඟීමකි. ඉක්මනින් ම නිවසට ගොස් තම බිරිඳට තුරුලු වී නිදා ගැනීමට ඔහුට සිතුණි. එසේ සිතමින් ඔහු තම කාරයේ යතුර කරකවා එය පණ ගැන්වූවේ ය.

එහෙත් එම මොහොතෙ ම ආ ඇමතුමකින් සියල්ල ම වෙනස් විය.

"සර්... ඉක්මනට කොර්විරාජ්වලට එන්න" එයින් කියැවිණි. එම ඇමතුම ආයේ ඔහු විසින් කොර්විරාජ් බස්නැවතුම අසල රාජකාරියට යෙදවූ තම පොලිස් ස්ථානයේ ම සාජන්වරයකුගෙනි.

"මොකක් හරි ලොකු දෙයක්" යෙරාජ් තමන්ට ම තොල් මතුරා ගත්තේ ය.

"එහෙම නැත්නම් උෆ මොකක් හරි පටලවගෙන"

තමා බස්නැවතුමේ නැවැත්වූයේ අලුතින් ම සේවයට පත් ව ආ කොලුවෙක් බැවින් ඔහුට එසේ ද සිතුණි. කෙසේ හෝ, ඔහුගේ හදවතට දැනෙමින් තිබුණු උණුසුමත්, තම බිරිඳගේ තුරුලෙහි පහසත් අමතක වී එම ඇමතුම නිසාවෙන් ආ කෝපයෙන් ඔහු වෙළී යන්නට විය. පණ ගංවා තිබුණු කාරය වේගයෙන් කොර්විරාජ් දෙසට හරවා ගත් ඔහු එය කොර්විරාජ් බස්නැවතුම දක්වා පදවන්නට පටන් ගත්තේ ය.

2

ඔහු කාරය කොර්විරාජ් බස්නැවතුම පෙනෙන මානයේ වූ පොලිස් මුරකුටිය අසල නවත්වන විටත් ඔහුට ඇමතූ පොලිස් සාජන්වරයා ඔහු එනතුරු මග රැක සිටියේ ය. එම සාජන්වරයා ආධුනිකයෙකි. මීට සතියකට පෙර අලුතින් වැඩ බාරගත් අයෙකි. ඒ නිසා ම දැඩි ශීතලේ එහාට මෙහාට වැනෙමින් සිටි ඔහු යෙරාජ්ගේ කාරය දකිත් ම එය ඉදිරියට ආවේ ය.

"කැප්ටන්" ඔහු යෙරාජ්ට සැලියුටයකින් ආචාර කොට එතැන නුදුරේ ම වූ බස්නැවතුමේ නවත්වා තිබුණු බස් රථයක් දෙසට අත දිගු කළේ ය. ශීතල නිසා වැනෙමින් සිටියාක් සේ ම ඔහුගේ මුහුණේ ඇත්තේ ද කැලැඹීමකි. ඔහු වචන පිට කළේ අවිස්වාසයෙන් සහා එම කැලඹීමෙන් යුතු ව ය.

"අතක් කැප්ටන්" ඔහු කීවේ ය.

ආධුනික සාජන්වරයාගේ කැලැඹීම දුටු යෙරාජ්ගේ නළල රැලි ගැසී ගියේ ය. ඔහු කියන්නේ කුමක් දැයි යෙරාජ්ට වැටහුණේ නැත.

"මොකක්?"

"කැප්ටන් අපිට අතක් හම්බුණා අර බස් එකෙන්" සාජන්වරයා යළිත් කීවේ ය. එවර ද සාජන්වරයා කියන්නට තටමන්නේ කුමක් දැයි යෙරාජ්ට නොවැටහුණෙන් ඔහු තම සගයා ඉදිරියේ සෘජුව ම හිටගත්තේ ය. යෙරාජ් මදක් කොට කෙට්ටු සිරුරකින් යුක්ත අයකු වුවත් ඔහුගේ මුහුණේ ඇත්තේ දැඩි බැල්මකි.

"මොන අතක් ද, තමුන් මොනවද කියන්නේ, හරියට කියනවා... ඇයි මොකක්ද වුණේ?"

"හරි කැප්ටන් හරි.." ආධුනික සාජන්වරයා සංසුන් වීමට යත්න දැරීය.

"මම මෙතැන රාජකාරි කරමින් හිටියේ.. එතකොට මට ඇහුණා අර බස් එකෙන්" කී ඔහු අත යළිත් බස් නැවතුමේ නවත්වා ඇති සුදු පැහැ බස්රථයකට දිගු කළේ ය. "ඔව්... ඒ බස් එකේ තමයි... මට ඇහුණා ඒ බස් එක පැත්තෙන් කෑ ගැසිල්ලක්... ඉතින් මම ඒ පැත්තට දුවන් ගියා. මම එතැනට යද්දිත් බස් එකේ ඩ්‍රයිවර් සූට්කේස් එක ඇරලා. ඒ මිනිහා මෝඩකමට ඒකේ තිබුණ අයිස් බෑග් එකත් ඇරලා බලලා"

"අයිස් බෑග් එකක්"

"ඔව් කැප්ටන්... ඒ අයිස් බෑග් එකේ තමයි අත තියෙන්නේ"

"මොන අත ද?"

"කැප්ටන් ඒක කපලා වෙන් කරපු අතක්... වැළමිට ළඟින් ම කපලා අයින් කරලා. ඒක මොන හේතුවකට හරි අර අයිස් අස්සේ හංගලා ඒ සූට්කේස් එකට දාලා"

තම සගයා පවසත් ම යෙරාජ්ගේ හැකිලී තිබුණු දෑස් විශාල විය.

"එනවා යන්න" කී ඔහු වේගයෙන් එම බස්රථය දෙසට පා නැඟී ය.

ඒ යන ගමන් ඔහු ඈත පිහිටි බස්රථය දෙස දෑසත් කුඩා කොට කිහිප වරක් ම බැලුවේ ය. එම බස්රථයේ ඇතුළත විදුලි ලාම්පු තවමත් දල්වා ඇත. එය වටා මිනිසුන් කිහිප දෙනෙක් හිටගෙන සිටියි.

"තමුසෙට හොඳට ම විශ්වාස ද ඒක අතක් කියලා?" ඔහු තම නිලධාරියාගෙන් ඇසුවේ ය.

"ඔව් සර්, කපලා වෙන් කරපු එකක්"

"හ්ම්" යෙරාජ් බස්රථය දෙස බලාගෙන ම මුමුනමින් ඔහුගේ සාක්කුවෙන් ගත් අත් වැසුම් දෙකක් ද කඩිනමින් පැලඳ ගත්තේ ය.

3

ඔවුහු බස්රථයට සමීප වෙත් ම බස් රථයේ දොර අසල හිටගෙන සිටි මිනිසුන් කිහිප දෙනා එතැනින් මඳක් ඉවත් ව යෙරාජ්ට බස්රථය ඇතුළට යාමට මග සලසා දුන්නේ ය. යෙරාජ් ඔවුන්ව මායිම් කළේ නැත. සෘජු ගමනින් ම බස්රථය තුළට ගිය ඔහු තම කුඩා දෑස් එහාට මෙහාට යවමින් එහි සෑම කොනක් ම හොඳින් නිරීක්ෂණය කළේ ය.

මෙය ප්‍රමාණයෙන් කුඩා බස්රථයක් නිසාවෙන් එහි ආසන පිහිටා ඇත්තේ එකිනෙකට වඩාත් ආසන්නව ය. එහි මැදින් ඇවිද යා හැකි කෙටි පදික තීරුවකි. එම පදික තීරුව කෙළවරෙහි රියැදුරු ආසනයට යාබද ව පොළවෙහි විවෘත වූ කළු පැහැ සූට්කේසයක් ඇත. යෙරාජ්ගේ දෑස් ඒ දෙසට එල්ල වෙත් ම ඔහු අසල සිටි නිලධාරියා "ඒක තමයි කැප්ටන්" යනුවෙන් පැවසූයෙන් යෙරාජ් සෙමෙන් සෙමෙන් තම පියවර ඒ දෙසට තැබුවේ ය.

සූට්කේසය අසලට ම පා තැබූ ඔහු ඒ තුළට නැඹුරු විය.

එය මඳක් ගැඹුරු සුට්කේසයකි. එහි හරි මැද අයිස් පිරවූ බෑගයක් ඇත. බසයේ විදුලි ලාම්පුවල සුදු ආලෝකය අයිස් බෑගයට වැදී එය රුධිරයේ පාටින් ම දිලිසෙන්නට විය.

"නැත" එහි රතු පාටින් පෙනෙන්නේ අයිස්වලට මිශ්‍ර වී ඇති රුධිරය ම ය. යෙරාජ් ඔහුගේ අතින් එම බෑගය මඳක් සෙලවූයේ ය.

එවිට අයිස් කැට තුළින් පිටතට ආ අතක් එම රුධිරය මත පාවෙන්නට විය. ඔහුගේ දෑස් එම දර්ශනයෙන් විශාල වී ගිය අතර, ඔහු එක්වර ම හිඳ සිටි තැනින් නැගිට්ටේ ය.

"ඉක්මනට ෆොරෙන්සික් එකට එන්න කියන්න" කී ඔහු තම අත් වැසුම ගලවා ඉණේ වූ වෝකිටෝකිය අතට ගත්තේ ය.

"මේ කැප්ටන් යෙරාජ් ඕජා, කොර්විරාප් බස්නැවතුමෙන්, අපිට කපලා වෙන් කරපු අතක් හමුවුණා... මම ආයෙත් කියනවා, අපිට කපලා වෙන් කරපු අතක් හමුවුණා; කරුණාකර ප්‍රධාන පොලිස් ස්ථානයෙන් කණ්ඩායමක් එවන්න" ඔහු කීවේ ය.

4

එතැනින් හෝරාවක කාලයක් ගෙවී ගිය තැන කෙයිලා ගම්මානයට නුදුරෙන් ම වූ වාල්ස් නගරයෙන් පොලිස් කණ්ඩායමක් කොර්විරාප් වෙත ආවෝ ය. එම කණ්ඩායම සමඟ ම එතැනට පැමිණි රස පරීක්ෂක කණ්ඩායමක් බස්රථය තුළ පරීක්ෂණ කටයුතු ආරම්භ කළ අතර පොලිස් කණ්ඩායම බස්රථය අසල ස්ථානය, එස්ටෝනියන් ආරක්ෂක සංකේත ගැසූ පොලිතීන්වලින් මුද්‍රා තැබීය. මේ අතර වාල්ස් හි පොලිස් ස්ථානාධිපතිවරයා සහ යෙරාජ් ඊට මෑතකින් වූ බස්නැවතුමෙහි සිගරට්ටුවක් උරමින් ඒ දෙස බලා සිටියහ. හිම පතනය පෙරටත් වඩා වැඩි වෙමින් තිබිණ. අවට දැඩි ශීතලකින් යුක්ත වූයෙන් ඔවුනගේ ප්‍රාශ්වාස පවා වාතය තුළට එකතු වනු මනාව දැක ගැනීමට හැකි විය. යෙරාජ්ගේ මුවින් පිටවූ දුම් වළලු එම ශීත වාතය තවත් බොඳ කර දැමීය.

"කොපේ හිතනව ද මේ මනුස්සයා තව ම ජීවත් වෙනවා කියලා" යෙරාජ් තමා අසල සිටි වාල්ස් හි ප්‍රධාන පොලිස්පති දෙස බලා විමසුවේ ය. ඔහු යෙරාජ්ට වඩා තරබාරු ශරීරයක් ඇති අයෙකි.

"වෙන්න පුළුවන්..." ඔහු කීවේ ය. "එහෙම නැත්නම් මළකඳ වෙන කොහෙන් හරි හමුවෙන්නත් පුළුවන්, මේ මාසේ ඇතුළත අපිට අතුරුදහන් වීම් ගැන පැමිණිලි කිහිපයක් ලැබිලා තියෙනවා. මම සුවීට කියන්නම් ඒ ෆයිල් ටිකත් යෙරාජ්ට එවන්න කියලා"

ඔහු සුවී නමින් හැඳින්වූයේ තම දෙවැනි නිලධාරිනිය යි. ඇය සත්මසක ගැබිනියක වුවත් තවමත් පොලිසියට අනියුක්තව සේවය කරමින් සිටියා ය.

"සුවී නිවාඩු යන්නැද්ද?"

"යන පාටක් පේන්න නැහැ. ඒකිත් හොඳ හයිය ගැහැනියක්... යෙරාජ් දන්නවනේ සුවී ගැන, මම හිතන්නෑ දරුවා ලැබෙන්න මාසෙකට කලින් හැරෙන්න සුවී නිවාඩු යයි කියලා"

"එහෙනම් කොපේ මේ පරීක්ෂණවලට සුවීව මෙහෙට එවන්න" කී යෙරාජ් තමන්ට නුදුරෙන් පොලිස් සංචිතයත් සමඟ රාජකාරියෙහි යෙදි සිටි ආධුනික සාජන්වරයා දෙස බැලුවේ ය. ඔහු තම කබායට දෑත ම ඔබා ගනිමින් ශීතලයේ වෙවුලමින් පරීක්ෂණ මෙහෙයවන පොලිස් නිලධාරීන් අසල හිටගෙන සිටියි.

"මිනිහා තව ම මේ වැඩවලට අලුත්, ඔය තමයි මුල් ම එක... ඒකත් කපලා වෙන් කරපු අතක්. ඒ නිසා තවමත් කම්පනයෙන් ඉන්නවා ඇත්තේ"

යෙරාජ් එසේ කියද්දි කොපේගේ මුවින් සිහින් සිනහවක් නික්මුණි. ඔහුගේ දෑසත් යෙරාජ් විසින් පැවසූ පොලිස් ස්ථානයට අලුතින් පත් වී ආ තරුණයා

වෙතට යොමු විය.

"යෙරාජ්ට මතක ද මගේ මුල් ම පරීක්ෂණය මොකක්ද කියලා?" ඔහු යෙරාජ්ගෙන් ඇසුවේ ය. යෙරාජ් එය නොදන්නා බව අඟවමින් හිස වැනී ය.

"කපලා වෙන් කරපු ඔළුවක්, ඒකත් වාල්ස් දිය ඇල්ලේ රිටක් උඩ ගහලා තිබ්බේ. මට ඒකේ තිබුණ කෙස් ගසක් ගැන පවා අදත් මතකයි" කී ඔහු අතීතය ආවර්ජනය කරන්නට මෙන් සිගරට්ටුවෙන් දුම් පොදක් වාතයට මුසුකොට දිගු හුස්මක් ඉහළට ඇද ගත්තේ ය.

"1990වේ... වාල්ස්වල කපලා වෙන් කරපු හිස" යෙරාජ් මිමිනුවේ ය. එකල ඔහු ද පොලිස් සේවයට ආධුනිකයෙකි. ඒ ඔහු කෙයිලාවලට ආ මුල් කාලය යි.

එකල කෙයිලා පොලිස් ස්ථානය වාල්ස් සහ නිත්වෙඉජා නගර යා කරමින් ඉදිකළ ප්‍රධාන පොලිස් ස්ථානයක් ලෙස වැජඹුණි. එහෙත් ටාලීන්වල සීඝ්‍ර සංවර්ධනයත් සමඟ ම වාල්ස් නගරය ද ක්‍රමයෙන් දියුණු වූ අතර කෙයිලාව එහි පුරාතනභාවයත් රැකගනිමින් ඒ ආකාරයෙන් ම පැවතුණි. වාල්ස් දියුණුවත් සමඟ ම එහි අපරාධ ප්‍රමාණයත් ඉහළ යන්නට වූයෙන් ටාලීන්වල විශේෂ අවධානයත් වාල්ස්වලට ම යොමු වන්නට විය. එය එස්ටෝනියාවේ ප්‍රධාන නගරයක් බවට පත් විය. එහි ප්‍රධාන පොලිස් ස්ථානයක් ද ඉදි කරනු ලැබීය. කෙයිලාවල සේවය කළ අයවත් එයට මාරුකොට දැමුවේ ය. අවසානයේ දී කෙයිලාවේ ඉතිරි වූයේ පැරණි පොලිස් ස්ථානයත් එහි සේවය කළ යෙරාජ් ඇතුළු තවත් එක් පොලිස් නිලධාරියකුත් පමණි. අනෙකාත් විශ්‍රාම ගිය පසුව වාල්ස්වලින් ම එයට ආධුනික පොලිස් සාජන්වරයකු එවනු ලැබීය.

කොපේ ඔහුගේ කතාව ආවර්ජනය කරද්දි තම පොලිස් ස්ථානයේ අතීතය ගැනත් වාල්ස් එය අභිබවා නැගී සිටි ආකාරයත් යෙරාජ්ට මතක් වූයෙන් ඔහුගේ හදවත ද සියුම් වේදනාවකින් පිරී යන්නට විය.

"ඔය සිද්දිය වුණේ මම කෙයිලාවලට පත් වෙලා ආපු අලුත. 1990වේ"

"ඔව්" කොපේ ද එය අනුමත කරමින් හිස වැනී ය. "90වේ, මීට අවුරුදු තිහකට කලින්, අපි දෙන්න ම හිටියේ අර කොලුවා අද ඉන්න තැන. ඒ නිසා යෙරාජ් උඟව හොඳට පුහුණු කරන්න ඕන." කොපේ යෙරාජ් දෙස බලමින් ගැඹුරු බවකින් එම වචනය පිට කළේ ය.

"හ්ම්" යෙරාජ් ද එය අනුමත කරන්නාක් මෙන් දැඩි බැල්මකින් තම ආධුනික සගයා දෙස බැලුවේ ය.

"උඟට තව කල් තියෙනවා, ටිකෙන් ටික ඉගෙන ගනියි. කවදා හරි කෙයිලා පොලිසියත් බලාගන්න ඉතුරු වෙන්නේ ඔය මනුස්සයා තමයි, මේක ටාලීන්වලින් වළපල්ලට යැවුවේ නැත්නම්" කී යෙරාජ් ඔහුගේ සිගරට්ටුව පොළවට දමා එය පයෙන් පොඩි කර දැමුවේ නුරුස්සන හැඟීමෙනි. කොපේට එම වචනවලින් යෙරාජ්ගේ සිතෙහි ටාලින් කෙරෙහි වූ කෝපය දැනුණෙන් ඔහු තම අත

යෙරාජ්ගේ උරහිසට තබා සෙලවූයේ ය.

"උන් මේක අයින් කරලා දැම්මොත් උඹ අර කොල්ලත් එක්ක වාල්ස්වලට එන්න ඕන... සොෆීවත් එක්ක වරෙන්... මම ඉතුරු හැම දේම බලාගන්නම්" ඔහු තම මිත්‍රයාට කුලුපගව පැවසුවේ ය.

5

කොර්විරාප් බස්නැවතුමෙන් හමුවූ කපා වෙන්කළ අත ගැන ආරංචිය කෙයිලාවල ව්‍යාප්ත වෙද්දි එම නගරයේ ජීවත් වූ මිනිස්සු එයින් කැලැඹී ගියෝ ය. කෙයිලාව කුඩා නගරයක් නොවේ. එය දස දහසකට වඩා ජනගහනයකින් යුක්ත වූ, හෙක්ටයාර් එකොළහක පමණ වපරිසරයක විහිදී තිබුණු මඳක් විශාල නගරයකි. එහෙත් එය සාමකාමී නගරයකි. එහි ජීවත් වූවෝ පැරණි සංස්කෘතියට ප්‍රිය කළ ක්‍රිස්තියානුවන් වූයෙන් මෙම නගරය තුළ අපරාධ සිදුවූයේ ඉතාමත් අවම වශයෙනි. එලෙස සිදුවූ සමහර අපරාධ පවා පල්ලියේ දේවගැතිවරුන්ගේ මැදිහත් වීමෙන් විසඳාලනු ලැබූවෙන් මෙම නගරය එස්ටෝනියාවේ සාමකාමී ම නගරයක් ලෙස ද හඳුන්වනු ලැබීය. එහෙත් මෙම සිදුවීම එම නගරයට කැළැලක් විය. කිසිවකු හෝ තම නගරයේ පාරිශුද්ධ බව කෙලෙසා දැමීමට මෙය ඕනෑකමින් ම කරන්නට ඇතැ'යි නගර වැසියෝ පොලීසියට සහ ටාලීන් හි ප්‍රධාන පොලිස් මූලස්ථානයට පැමිණිලි කළහ. මෙම සිද්දිය ම දඩමීමා කරගත් කෙයිලා හි මාධ්‍ය විසින් ඔවුන් ව තවත් උසි ගන්වන්නට පටන් ගත්තේ ය. සිදුවීම ගැන විවිධාකාර සහ මනඃකල්පිත ප්‍රවෘත්ති තම වෙබ් අඩවිවල පළකරමින් ඔවුහු එයින් ප්‍රයෝජන ගත්හ.

සියල්ල ම මේ ආකාරයෙන් සිදුවෙමින් තිබිය දී සිදුවීමෙන් දිනක් ගෙවී ගිය තැන කොපේ සේවය කළ වාල්ස් පොලිස් ස්ථානයට දුරකතන ඇමතුමක් ලැබිණ. එය ආයේ ටාලීන් හි නගරාධිපති කාර්යාලයෙනි. එයින් කියවුණේ " කෙයිලාවෙන් හමුවූ කපා වෙන් කළ අත ගැන සම්පූර්ණ පරීක්ෂණ වාර්තාවක් හැකි ඉක්මනින් නගරාධිපති කාර්යාලයට එවන ලෙස ය."

කොපේ එම ඇමතුමින් සුදුමැලි වී ගියේ ය. තත්ත්වය තවත් උඩු දුවන බවත්, මෙහි පරීක්ෂණ සඳහා තම පොලිස් ස්ථානයෙන් කෙනෙකුව ඉක්මනින් ම කෙයිලා බලා පිටත් කර යැවීමේ අවශ්‍යතාවත්, ඔහුට ඉන් ප්‍රත්‍යක්ෂ විය. ඔහුට තෝරාගැනීමක් නොවී ය. මෙවන් බාරදූර රාජකාරියක් විශ්වාසවන්ත ව භාර දිය හැක්කේ ඇයට පමණි. ඇය කුමන ක්‍රමයකින් හෝ මෙය අවසන් කර

දමන බැව් කොපේ දැන සිටියේ ය.

වාල්ස් හි උපපොලිස් පරීක්ෂකවරියක ලෙස සේවය කළ සුවී සෙප්පේ අපේ කතාවට පිවිසෙන්නේ මේ ආකාරයෙනි.

6

සුවී සෙප්පේ තරුණ ය. වයස අවුරුදු තිහක පමණ කාන්තාවක් වූ ඈ බැලූ බැල්මෙන් ම පිරිමියකු මෙන් උස මහත සාමාන්‍ය ගැහැනියකට වඩා විශාල ශරීරයක් තිබූ අයෙකි. ගෙවී ගිය මාස හතක කාලය තුළ ඇයගේ සිරුර තවත් මහතින් වැඩී තිබිණ. මේ සිදුවීම සිදුවන විට ඇය මාස හතක ගැබිනියකි. එස්ටෝනියානු නීතිය අනුව කාන්තාවක් ගර්භනී වූ පළමු මස දී ම ඇයට ප්‍රසූත නිවාඩු සහ දීමනාව ලබා ගත හැකි ය. එහෙත් සුවී සෙප්පේට එවන් අවශ්‍යතාවක් නොවී ය. රජයේ සලාකය හිතාමතා ම ප්‍රතික්ෂේප කර දැමූ ඇය දරුවා ලැබෙන අවසන් මස දක්වා ම වාල්ස් හි සේවය කිරීමට සූදානම් ව සිටියා ය. හැරත් දරුවකු ලැබෙන පළියට, බඩ මහත් වූ ආකාරයට කාන්තාවකගේ කායික ශක්තිය හීන වන්නේ නැත. එය එලෙස සිදුවෙතැ'යි එස්ටෝනියානුවන් විශ්වාස කළත් සුවී එය විශ්වාස කළේ නැත. බඩ ක්‍රමයෙන් වැඩි වත් ම තම ශක්තියත් ඒ ආකාරයෙන් ම වර්ධනය විය යුතු යැයි තීරණය කළ ඇය දරුවා කුස තුළ සිටිය දී පවා උදෑසන ව්‍යායාම්වල නිරත විය. ඇය ශක්තිමත් වූවා සේ ම තම දරුවත් දිනෙක ශක්තිමත් වන බැව් ඇය විශ්වාස කළා ය. විශේෂයෙන් ම ඇයගේ කුස තුළ වර්ධනය වෙන්නේ ගැහැනු කළලයක් බැව් ඈ දැන සිටියෙන්, එය පිරිමියකුටත් වඩා ශක්තිමත් ව වර්ධනය විය යුතු යැයි ඇය නිගමනය කළා ය.

7

ශීත කාලයේ අරුණෝදය ප්‍රියමනාප ය. සූර්ය කිරණ ක්‍රමඃ ක්‍රමයෙන් නැග එද්දි එහි උණුසුම හිම පියලි මත තම අණසක පැතිර වීම ආරම්භ කරයි. උණුසුම වැඩි වෙත් ම හිම පියලි එකට ඇලී දිය වීමට පටන් ගනී. ඒවා ජලය බවට පත් වෙයි. මාර්ගයන් හි ගලා යයි. එවන් මොහොතක සූර්ය රශ්මිය අඩු වී ගිය හොත් ගලාගෙන යන මෙම ජලය පරිසරයේ ශීතලත් සමඟ එකතුව අයිස් බවට පත් වෙයි. ශීත කාලයට අයිස් බැඳුණු මෙවන් මාර්ගයන් අතිශයින් ම භයානක ය. මේවා නිසා රිය අනතුරු වැඩි වන අතර ශීත කාලය මිනිස්සු වැඩිපුර ම රිය අනතුරුවලට භාජනය වන කාලය බවට ද පත් වෙති. මේ හේතුව නිසා ම ශීත කාලයට එස්ටෝනියාවේ උදෑසන ආරම්භ වෙන්නේ මාර්ගවලට වැලි අතුරමිනි. එවන් කාලයන් හි උදෑසන ම එස්ටෝනියානු මාර්ගවල ගමන් කරන ඔබට මාර්ගයට වැලි දමන කම්කරුවන් සහ වැලි හලමින් යන ලොරි රථ අනන්තවත් දැක ගත හැකි වනු ඇත.

සුවී සෙප්පේත් වාල්ස් සිට කෙයිලා දක්වා යමින් සිටියේ මෙවන් මාර්ගයක ය. ඇය පදවමින් සිටි රෙනොල්ට් ක්ලියෝ වර්ගයේ කළු පැහැ කාරය මාර්ගයේ මැද තීරුවේ ඇති වැලි ඇති සලකුණු දිගේ සීරුවෙන් ඉදිරියට ඇදුණි. ඒ යන අතරතුර කාරයේ රේඩියෝව දැමූ ඇය එයින් ඇසෙන එස්ටෝනියානු පොප් ගීතයකට සවන් දීමට පටන් ගත්තා ය. එම ගීතයේ තනුවට අනුව තම කුසට කිහිප වරක් තට්ටු කළ ඈ,

"ඔයත් මේක අහන්න" කියනවාක් මෙන් යාන්තමින් තොල් මිමිනුවා ය. තමාගේ සිතුවිලි තම කුස තුළ සිටින දරුවාටත් ඇසෙතැ'යි සිතූ ඈ එයින් වඩාත් උද්යෝගිමත් වන්නට විය. ඇය රේඩියෝවේ හඬ වැඩි කළා ය. එම ගීතයට අනුව හිස වැනුවා ය. උරහිස් තාලෙට සෙලෙවුවා ය. ඒ අතර ම ඉරිච්චත් එන්න එන්න ම වැඩි වන්නට වූයෙන් ඈ කාරයේ උඩු පියන මත වූ අවි කන්නාඩිය ගෙන ඇයගේ දෑස් ආවරණය කරගත්තා ය.

කාරය වේගයෙන් කෙයිලා නගර සීමාවට ආසන්න වෙමින් තිබිණ. එය නගර සීමා සලකුණු කර ඇති දැන්වීම් පුවරුව අසලට ළං වෙත් ම සුවී එයින් පිනා යන්නට විය.

"ඔන්න පිපී අපි කෙයිලාවලට ආවා" ඇය තම කුස තුළ වූ දියණියටත් ඇසෙන්නට කීවා ය. (තම කුස තුළ වැඩෙන්නේ දියණියක් බැව් ස්කෑන් පරීක්ෂණයෙන් ඈ දැනගත් දා පටන් එම දියණිය ව සැබැහින් දැනෙන තුරු ඇයට ඉස්පාසුවක් නැත). කුසට අත තබා කතා කරන සෑම මොහොතක

ම ඇයත් තමන් සමඟ කතා කරතැ'යි සුවීට හැඟුණෙන් සුවී නිරන්තරයෙන් ම එසේ කරන්නට පුරුදු වී සිටියා ය. ඇය තම දියණියට "පිපී" ලෙස නම් තැබුවේ ද ඒ නිසා ය. එය සරල ය, උච්චාරණයට පහසු ය. එම අකුරු දෙකෙහි තේරුමක් ඇත්දැ'යි ඈ දැන නොසිටියත් එය තම කුස තුළ සිටින දියණියත් සමඟ කතා කිරීමට පහසු ම නම බැව් ඈ සිතන්නට විය.

"ඔයා ඉක්මනට අම්මි ළඟට එන්න ඕන"

ඇය මාර්ගය දෙසටත් අවධානය යොමු කරමින් තම කුසත් එක් අතකින් අල්ලමින් එයට සෙමෙන් තට්ටු කරමින් කීවා ය.

ඒත් සමඟ ම ඇයගේ දෑස් මාර්ගයේ මීටර් කිහිපයක් ඈතින් වූ යමක් වෙතට ළං විය. දිලිසෙමින් පැවති අයිස් මත කළු බෝලයක් මෙන් මුලින් ම දර්ශනය වූ මෙය පසුව වඩාත් පැහැදිලි ව පෙනෙන්නට වූයෙන් ඇය එක්වර ම වහානයේ තිරිංග තද කළා ය. වහානය අඩි කිහිපයක් ම ඉදිරියට ලිස්සා ගොස් එය හරියට ම එම "සත්වයා" අසල ම නතර විය.

ඒ පිනි මුවෙකි. මාර්ගය හරහා ගමන් කරමින් සිටි ප්‍රමාණයෙන් විශාල පිනි මුවෙකි.

සුවීගේ කාරය පිනි මුවාගේ පාද අසල නතර වත් ම උගේ රවුම් දෙනෙත් සුවී දෙසට හැරිණි. උෆ එම දුඹුරු පැහැ දෑස් තුළින් සුවී දෙස තත්පර කිහිපයක් බලාගෙන සිටියේ ය. එම දෑස් තමන්ට කුමක් හෝ කියන්නේ යැයි සුවීට දැනිණි. ඒ නිසා ම ඇයගේ දෑස් ද උෆගේ දෑස් මතට ම රැඳිණි. මෙලෙස ස්වල්ප මොහොතක් ගෙවී ගිය තැන යළිත් මාර්ගය දෙසට හැරුණු පිනි මුවා සෙමින් ගමනින් එතැනින් යන්නට පටන් ගත්තේ ය. සුවී නිසොල්මන් ව ඒ දෙස බලා සිටියා ය. උෆගේ විශාලත්වය සේ ම උෆගේ ගමනේ ඇත්තේ ද ගාම්භීරත්වයකි; මනා වූ උජාරුවකි.

එහෙත් උෆ තමන් දෙසට හැරි බලා සිටියේ ඇයි? සුවී නැවත සිතන්නට විය. එස්ටෝනියාවට පිනි මුවන් විශේෂත්වයක් නොවී ය; උන් සුලබ ය. විශේෂයෙන් ම හිමෙන් වැසී ගිය මෙවන් කඳුකර මාවත්වල උන්ව වඩාත් දැක ගත හැකි ය. එහෙත් මෙම සිදුවීමේ කුමක් හෝ විශේෂත්වයක් ඇත.

මාර්ගය හරහා ගිය පිනි මුවා එහි අනෙත් පස වූ ලඳු කැලෑව දෙසට ඇවිද ගොස් අතුරුදහන් වී යනතුරු ම ඒ දෙස බලා සිටි සුවී යළිත් තම කාරය පණ ගැන්වීය. ඇය නිහඬ ය... තවමත් ඇයගේ දෑස් තුළ කුතුහලයක් ඇත.

"පිපී ඔයාට එයාට දකින්නයි තිබුණේ, උෆ මට මොකක් හරි කියන්න හැදුවා... මොකක් ම හරි" කී ඇය තම කුසට තට්ටුවක් දමා යළිත් කාරය වේගවත් කළා ය. ඔවුහු ඒ වන විටත් කෙයිලා නගර සීමාවට අවතීර්ණ වී සිටියහ.

4

කෙයිලා හි පොලිස් ස්ථානය ඉතාමත් කුඩා එකකි. ආදි එස්ටෝනියන් ජනාවාසවල ඇති පරිද්දෙන් තනි කළු ගල් කුට්ටිවලින් සාදා ඇති පැරණි නිවසක් පසුකාලීන ව මඳක් ප්‍රතිසංස්කරණය කොට කාර්යාලයක් ලෙස සකසා තිබිණ. මෙහි ප්‍රධාන දොරෙන් ඇතුල්වෙත් ම ඇති විශාල සාලයෙහි පොලිස් ස්ථානයේ ලේකම්වරිය "කරීනේ" නමින් හැඳින්වූ හැට හැවිදිරි කාන්තාව හිඳගෙන සිටී අතර ඇයට දකුණු පසින් ඇති කාමරය පොලිස් ස්ථානාධිපතිගේ කාමරය ලෙස වෙන් කොට තිබිණ. එහි "පොලිස් ස්ථානාධිපති" යන නාම පුවරුව යටින් "කැප්ටන් යෙරාජ් ඕජා" ලෙස සටහන් කොට ඇත. එයට නුදුරෙන් ම වූ තවත් කාමරයක් නවක සාජන්වරයා වෙනුවෙන් වෙන් වී තිබුණි. එහි වම් පස ඇතුළට වන්නට කළුගලින් ම තනන ලද කුඩා සිරමැදිරියක් ද ඒ අසල ම පොලිසියේ ගබඩා කාමරය ද විය.

තම කාමරයේ හිඳගෙන සිටි යෙරාජ් හිස ඔසවා ඔහුගේ කාර්යාල බිත්තියේ ඇති ඔරලෝසුව දෙස බැලුවේ ය. එහි හෝරා කට්ට උදෑසන එකොළහට ආසන්න ව ඇත. ඇය වාල්ස්වලින් උදෑසන ම පිටත් වූවා නම් මේ වෙද්දීත් කෙයිලාවලට පැමිණ සිටිය යුතු ය. යෙරාජ් ඔහුගේ පුටුවට හිස තබා දිගු හුස්මක් ඉහළට ඇද ගත්තේ ය. ඔහුගේ දෑස ඔහුගේ හිසට උඩින් ඇති එස්ටෝනියානු පොලිස් සංකේතය දෙසටත් ඊටත් උඩින් බිත්තියෙහි එල්ලා ඇති පිනි මුවකුගේ අං තට්ටුව වෙතත් ඇදුණි. එම අං තට්ටුව ඔහු මෙම පොලිස් ස්ථානයට ආ දා පටන් ම එතැන ඇත. මීට වසර තිහකට පෙරාතුව තරුණ සාජන්වරයකු ලෙස පොලිසියේ වැඩ බාරගත් මුල් කාර්තුවෙත් ඔහු එය මෙම කාමරය තුළ දී මේ ආකාරයෙන් ම දැක ඇත. ගෙවී ගිය වසර තිහ පුරා ම එහි වෙනසක් වී නොමැත. එය එල්ලූ තැන ම තවමත් එලෙසම ය. ඒ දෙස බලා සිටිය දී ම එක්වර ම ඔහුට පොලිස් ස්ථානය ඉදිරියෙන් වහානයක හඬක් ඇසුණෙන් ඔහු තම කාර්යාල ජනේලය මඳක් විවර කොට පිටත බැලීය. 'කළු පැහැ රෙනෝල්ට්' කාරයක් පොලිස් ස්ථානය ඉදිරියෙහි නවත්වා ඇත.

ඒ කාරය කාගෙ දැයි හඳුනාගත් යෙරාජ් ඕජා මේසය මත වූ හිස් වැසුමත් අතට ගෙන තම ආසනයෙන් නැගී සිටියේ ය.

෧

පොලිස් ස්ථානයට ඇතුල් වෙත් ම යෙරාජ්ව දුටු සුවී එයින් ප්‍රබෝදයට පත් විය. ඇය තම කුස එක් අතෙකින් අල්වාගෙන "පිපී ඔන්න යෙරාජ් අංකල් ඉන්නවා" යැයි මුමුනා සිනහා මුසු මුහුණින් යෙරාජ් ළඟට ඇවිද ගියා ය. යෙරාජ් ඉදිරියට පැමිණ සුවීව වැලඳ ගත්තේ ය. යෙරාජ් කොට අයකු වුවත් සුවී ඔහුට වඩා දෙගුණයක් පමණ මහත කෙනකු වූයෙන් ඈව වැලඳ ගනිද්දී යෙරාජ්ගේ මුහුණින් මතුවූයේ හාස්‍යජනක සිනහවකි. ඔහු එම සිනහවෙන් ම දෑසත් පොඩි කර සුවීගේ කුස දෙස බැලීය.

"දුවෙක් ද පුතෙක් ද?" ඔහු ඇසුවේ ය.

"දුවෙක්..." ඇය එසේ පවසා කුසට තට්ටු කර,

"පිපී ඔයාට ඇහෙනවා ද"යි ඇසූයෙන් යෙරාජ්ගේ මුහුණේ වූ සිනහව එයින් තවත් වැඩි විය.

"පිපී" ඔහු මිමිනුවේ ය.

"ඔව් පිපී" සුවී සෙප්පේ ද පිළිතුරු දුන්නා ය.

යෙරාජ් කටත් උලුක් කර එය ලස්සන නමක් කියන්නාක් මෙන් හැඟීමක් පෑය. ඒත් සමඟ ම සුවීගේ දෑස යෙරාජ්ට පිටුපසින් වූ පොලිස් කාර්යාලයේ ලේකම්වරිය වෙතට යොමු විය.

"කරීනේ" යැයි මිමිනූ සුවී ඈව වැලඳ ගත්තා ය. කෙයිලා පොලිස් ස්ථානය සුවීට නුපුරුදු තැනක් වූයේ නැත. වාල්ස්වල සේවය කළ පසුගිය වසර දහයක කාලය තුළ ඇය මෙම ස්ථානයට සිය පාරකට වඩා පැමිණ ඇත. ඒ සෑමවිට ම ඔවුන්ගේ හමුවීම මේ ආකාරයට ම සිදුවිය. එහෙත් සුවී, පොලිස් ස්ථානයට පත් වී ආ නවක නිලධාරියා ව දකින්නේ මුල් ම වතාවට නිසාවෙන් යෙරාජ් ඔහුව සුවීට හඳුන්වා දුන්නේ ය.

"සුවී මේ සාජන් අර්වෙඩ්"

සුවී ඔහුට අතට අත දී ආචාර කළා ය. ඔහු තරුණයෙකි. සුවී තරම් ම උස් අයකු වුවත් ඔහුගේ මුහුණේ ඇත්තේ ඔහුගේ වයසටත් වඩා කුඩා පෙනුමකි. එසේම සුවීට ආචාර කරද්දි ඔහුගේ අතේ වූ මෘදු බව සුවීට වැටහිණි. එහෙත් එයට අවධානයක් යොමු කිරීමට තරම් කාලයක් සුවීට තිබුණේ නැත. ඇය මෙහි පැමිණි රාජකාරිය මේ මොහොතෙ ම ආරම්භ කළ යුතු ය. තම පොලිස් කබායේ ශිපරය විවර කළ ඈ එහි ඇතුළත අටවාගෙන සිටි ෆයිල් කවරයක්

ගෙන එය යෙරාජ්ගේ අතෙහි තැබීය. ඔහු එය දිග හැරියේ ය. එහි ඉදිරියෙන් ම වූයේ කළු හිස කෙස්වලින් යුත් තරුණියකගේ ඡායා රූපයකි.

"ලුතීනා නොයාල්... මීට මාසෙකට කලින් ටාලීන්වල දී අතුරුදහන් වෙලා තියෙන්නේ" ඇය කීවා ය.

10

සුවී එසේ පවසා කටගත් ම කෙයිලා පොලිස් ස්ථානයේ දුරකතනය නාද විය. එහි බිත්ති තනි කළු ගලෙන් සාදා තිබුණු නිසාවෙන් දුරකතනය නාද වෙත් ම පොලිස් ස්ථානයෙන් ආයේ දෝංකාරයකි. කරීනේ ඉක්මනින් ම රිසීවරය ඇයගේ අතට ගත්තා ය. කැප්ටර් යෙරාජ් ඕජාගේ දෑස් තවමත් සුවී විසින් දුන් පින්තූරයට යාවී ඇත. ඒත් සමඟ ම ඔහුගේ මනස කරීනේ විසින් පිළිතුරු දෙන්නා වූ ඇමතුමටත් යාවී තිබුණි.

"කොහේද" කරීනේ අසනු ඔහුට ඇසුණෙන් යෙරාජ් අනිත් පස හැරී කරීනේ දෙස බැලුවේ ය. ඇයගේ දෑස් විශාල ව යෙරාජ් වෙතට එල්ල වී ඇත. ටික වෙලාවකින් ඒ පුදුමයෙන් වික්ෂිප්ත වූ දෑසින් ම ඇය යෙරාජ්ට රිසීවරය දික් කළෙන් යෙරාජ් ද සැකයෙන් යුක්තව එය අතට ගත්තේ ය.

"හෙලෝ"

"කැප්ටන් ඕජා... මේ කිලිකෝ දේවස්ථානයේ ෆර්ඩෝ පියතුමා... මේක අන්තිම අසුභ ආරංචියක්, හැකි ඉක්මනින් ම දේවස්ථානයට එන්න."

ඔහුගේ කටහඬේ ඇත්තේ තැති ගැන්මකි; එසේම නොසන්සුන්කමකි. ෆර්ඩෝ පියතුමා ඉතාමත් ශාන්තිමත් ව කතා කරන තැනැත්තකු වූවෙන් ඔහුගේ මේ ක්ෂණික වෙනස් වීමෙන් ම කුමක් හෝ බරපතල දෙයක් සිදුවී ඇති බැව් කරීනේට හැඟී තිබිණි.

එම කටහඬ ඇසෙද්දි එය ම යෙරාජ්ට ද සිතෙන්නට වැඩි වෙලාවක් ගියේ නැත. ඔහු පියතුමාගෙන් තවත් කුමක් හෝ ඇසීමට තැත්කළත් පියතුමා ඒ මොහොතෙ ම රිසිවරය යළිත් තැබූයෙන් යෙරාජ් ද දොර අසල කොක්කක් මත එල්ලා තිබුණු ඔහුගේ ලෝම ලෝගුව ඇඟලාගෙන පිටත්ව යාමට සූදානම් විය.

"කැප්ටන් මොකක්ද වෙලා තියෙන්නේ?" සුවී ඇසුවා ය.

"දන්නෑ.. ඒත් මොකක් හරි ලොකු දෙයක් වෙලා තියෙනවා... මේ අවුරුදු කිහිපයට ම පොලීසියට කිලිකෝ දේවස්ථානයෙන් ඇමතුමක් ලැබුණු පළමු වතාව" යෙරාජ් කරීනේගේ මුහුණ දෙස බැලුවේ ය. ඇයත් එය අනුමත කරමින්

හිස සලා ලොකු කරගත් දෑසින් ම බලා සිටියා ය.

"සුවී... ඔයා විවේක ගන්න.. මම ගිහින් බලලා එන්නම්, අර්වෙඩ් ඔයා ෆොරෙන්සික් එකට කෝල් කරන්න, කොර්විරාජ්වලින් හමුවුණ අතේ ඩී. එන්. ඒ වාර්තාව ඉක්මනට අරගන්න... මේ ෆයිල් එකත් මගේ කාමරෙන් තියන්න" කී ඔහු තම අතේ වූ ෆයිල් කවරය අර්විඩ් අත තබා දොර දෙසට හැරිණ. එහෙත් සුවී ද ඔහු පසුපස යන්නට පටන් ගත්තා ය.

"කැප්ටන් මමත් එනවා" තම කබායේ ෂිපරය දමා ගත් ඇය යෙරාජ් ඕජා සමඟ ම පොලිස් ස්ථානයෙන් පිටත් විය.

11

කිලිකෝ දේවස්ථානය ක්‍රිස්තු පූර්ව 14 වන සියවසේ කෙයිලාවල ඉදිකරන ලද පැරණිතම දේවස්ථානයකි. එය එස්ටෝනියාවේ ඇති ඓතිහාසික දේවස්ථාන අතරින් පැරණි ම එකක් ලෙස ද පිළිගනියි. මෙම දේවස්ථානයේ ප්‍රධාන ම කොටස මේ වෙද්දීත් නටබුන් ලෙස අවශේෂ වී ඇති මුත් එහි පැත්තක වූ පසුකාලීන ව ඉදිකරන ලද කුඩා දේවස්ථානය රජය විසින් අලුත් වැඩියා කොට තිබිණ. එය තම වාසස්ථානය කොට ගෙන ෆර්ඩෝ පියතුමා ජීවත් වූයේ ය. ඔහු වයස අවුරුදු හැත්තෑවක පමණ මහලු පියතුමෙකි. දේවස්ථානයේ ප්‍රධාන කොටස් සියල්ල ම පාහේ නටබුන් බවට පත් වී ඇති බැවින් එහි කිසිදු දේව මෙහෙයක් සිදුවූයේ නැත. විවිධ රටවලින් පැමිණෙන සංචාරකයින්ගෙන් සහ එස්ටෝනියනු වැසියන්ගෙන් ම පමණක් මෙම දේවස්ථානය නඩත්තු වන්නට වූ අතර එම ආධාරවලින් ම ෆර්ඩෝ පියතුමා ද ජීවත් වූයේ ය.

යෙරාජ් කාරය දේවස්ථානයේ ගේට්ටුව ඉදිරියෙන් නතර කරත් ම ඔහුව බලාපොරොත්තුවෙන් මග බලා සිටි ෆර්ඩෝ පියතුමා ඔහු ඉදිරියට පැමිණෙන්නට විය. පියතුමාත් සමඟ ම ගේට්ටුව ඉදිරියට දුව ආයේ සුදු පැහැති "හස්කින්" වර්ගයේ බල්ලෙකි. ඌ ගේට්ටුව ඉදිරියේ නතර කළ පොලිස් කාරය දෙස බලමින් බුරන්නට පටන් ගත්තේ ය. ෆර්ඩෝ පියතුමා ඔහුගේ ඇඟිල්ල දිගු කර බල්ලාව පාලනය කිරීමට උත්සහා කළේ ය.

"ඔහොම නැවතියන් ලූනා.. ඔතැන ම නැවතියන්... මේ මහත්තුරු ඇවිත් තියෙන්නේ රාජකාරියට"

ඔහු එසේ කියත් ම බල්ලාගේ බිරීමත් නතර වූ අතර ඌ පියතුමා ඉදිරියේ ම සංසුන්ව හිඳගත්තේ ය. යෙරාජ් සහ සුවී කාරයෙන් බැස පියතුමා අසලට විත් හිටගත්හ. පියතුමා ඔවුන් දෙදෙනාව කාරුණිකව පිළිගත්තේ ය. එහෙත්

ඔහුගේ දෑස්වල ඇත්තේ තැති ගැන්මකි.

"මහා විනාශයක් ඕජා... මහා ම මහා විනාශයක්"

ඔහු යෙරාජ්ගේ දෑස් ළඟට ළං ව වටපිට කිසිවකුටත් නොඇසෙන්නට මුමුනන්නාක් මෙන් කෙඳුරුවේ ය. ඒත් සමඟ ම ඔහුගේ දෑස සුවී දෙසත් ඇයගේ ඉදිරියට නෙරා විත් ඇති කුසටත් යොමු විය.

"පියතුමනි මේ සුවී සෙප්පේ... ඔබතුමාට මතක ඇති ඇයව" ඔහු එසේ කියත් ම පියතුමා සුවී දෙස දෑස් පුංචි කර බැලුවේ ය.

සුවී ද ආයාසයකින් ව්‍යාජ සිනහවක් මවා ගත්තා ය.

"එහෙත් මේ දැරිවි මේක දකින්න හොඳ නැහැ'යි කියලයි මම හිතන්නේ" මිමිනූ පියතුමා මොහොතක් සුවී දෙස බලා සිට යළිත් එම තීරණය වෙනස්කර ගත්තේ ය.

"හ්ම් කමක් නැහැ... යමු යමු ඉක්මනට" කියමින් ඔහු කුඩා දේවස්ථානය දෙසට ඇවිදින්නට පටන් ගත්තේ ය. සුවී සහ යෙරාජ් ද ඔහුගේ පිටුපසින් පා නැගුහ.

12

මෙම කුඩා දේවස්ථානය නටබුන් වී ගිය ප්‍රධාන දේවස්ථානයට වඩා හාත්පසින් ම වෙනස් එකකි. එය දේවස්ථානයක් ලෙස හඳුන්වනවට වඩා ෆර්ඩෝ පියතුමාගේ වාසස්ථානය ලෙස හැඳින්වුවත් වරදක් නැත. එයට ඇතුල් වෙන තැන ඉදිරියෙන් ම ඇත්තේ අල්තාරයක් මත ඉදිකරන ලද ලී කුරුසයකි. එම කුරුසය ප්‍රමාණයෙන් විශාල එකක් වූ අතර එයට ඉදිරියෙන් එක් දිගු බංකුවක් පමණක් තබා ඇත.

දේවස්ථානයට ඇතුල්ව කුරුසයට දෑස් යොමුවත් ම පියතුමා එය ඉදිරියේ වැඳ වැටී ඔහුගේ ශරීරයට කුරුස සලකුණ තබා ගත්තේ ය. ඉන්පසුව ඔහු කුරුසයට පැත්තකින් වූ කුඩා කොරිඩෝවක් දිගේ ඇතුළට ගොස් එහි පිටුපස කොටසේ තිබුණු කාමරයට ඇතුළු විය. එය පියතුමා වාසය කරන කාමරය බැව් දැන සිටි යෙරාජ් එයට ඇතුල් වූයේ නැත. ඔහු සුවීත් සමඟ එහි දොර ඉදිරියේ හිටගත්තේ ය. එහෙත් පියතුමා ඔවුන් දෙසට හැරුණේ ය.

"ඔබ මේක දකින්න ඕන ඕජා... දෙන්න ම ඇතුළට එන්න" කී පියතුමා ඔවුන් දෙදෙනාවත් කැටුව කාමරය දිගේ ගමන් කරන්නට විය.

මෙය දේවස්ථානයේ ම පිටුපස කොටස වුවත් එය පිටතින් පෙනෙනවාටත් වඩා විශාල ස්ථානයකි. තනි කාමරයකටත් වඩා එය පුද්ගලයින් කිහිප දෙනකුට ම වාසය කළ හැකි දැවැන්ත සාලයක් වැනි එකකි. එහි කෙළවරට ම වන්නට තිර රෙදිවලින් ආවරණය කරන ලද පියතුමාගේ නිදන ඇඳ පිහිටා තිබිණ. මෙහි බිත්ති අඩි විස්සක් පමණ උස් වූ නිසාවෙන් කාමරයේ ජනෙල් තිබුණේ වහලට යාබදව ය. විශාල ජනෙල් පහකින් පමණ කාමරය තුළට පැහැදිලි සූර්යාලෝකය ලැබෙමින් ඇත. කාමරය දිගේ ටික දුරක් ගමන් කළ ෆර්ඩෝ පියතුමා එක්වර ම එතැන බිම තබා තිබුණු බන්දේසියක් ළඟ නතර විය.

"ඕජා... මේ තමයි මම ලූනට කෑම දෙන පිඟාන" පියතුමා පිඟානට නැඹුරු ව එය අතට ගත්තේ ය.

එහි වූයේ කා ඉතිරි කරන ලද මස් කුට්ටි කිහිපයකි. ඒවා දකිත් ම ඕජාගේ නළල රැලි ගැසී ගියෙන් ඔහු සුවී දෙස බැල්මක් හෙළී ය. පියතුමා එම මස් වැදැලිත් සමඟ තමන්ට කියන්නට හදන්නේ කුමක් දැයි ඔහුට තේරුණේ නැත. ඔහු තමන්ට මෙතැනට පැමිණෙන්නැ'යි පැවසුයේ තවත් විපත්තියක් නිසා'යි යෙරොජ් සිතුවත් පියතුමා පිඟාන පෙන්වද්දී එම සිතුවිල්ලත් ඔහුගේ සිතෙන් පහව යන්නට විය. ඒ නිසා ම ඔහු ඒ කෙරෙහි වැඩි සැලකිල්ලක් දැක්වූවේ නැත.

පියතුමා කිසිවක් නොකියා තවමත් බල්ලාට කෑම දෙන පිඟාන ඔවුන් වෙත දික්කර ගෙන සිටියි.

"පියතුමා අපිට එන්න කිවුවේ" යෙරොජ් එම පිඟානෙන් දෑස් ඉවතට ගනිමින් පියතුමාගෙන් ඇසීය. එහෙත් පියතුමාගේ දෑස් තවමත් රැඳී ඇත්තේ යෙරොජ් දෙස ය. ඔහුගේ අතේ ඇති පිඟානත් උවමනාවෙන් ම යෙරොජ් වෙතට දික් වී ඇත.

"හොඳට බලන්න ඕජා" පිඟාන තවත් ටිකක් යෙරොජ්ගේ දෑසට යා කරමින් පියතුමා කීවේ ය.

ඔහු එසේ කියද්දි යෙරොජ් නළලත් රැලි කොටගෙන පිඟාන දෙස බැලුවේ ය. එහෙත් එහි වූ මස් වැදලි කිහිපයක් හැරෙන්නට ඔහු වෙනත් කිසිවක් දුටුවේ නැත.

සුවී ද පියතුමා පිඟාන දික් කරද්දි එයට ළං වී බැලී ය. එහි වූ යමක් ඈ දකින්නට ඇත. එයින් ඇයගේ දෑස් විශාල වී ගියා ය. ඒවායෙන් ආයේ අප්‍රසන්න හැඟීමකි. ඇය තමා සිතුණ දේ ම පියතුමාත් කියන්නට යත්න දරන්නේ දැයි බැලීමට පියතුමාගේ දෑස් දෙස එම අප්‍රසන්න ලීලාවෙන් ම බැලුවා ය.

"ඔව්, ඔබ ඒක දැක්කා..." කී පියතුමා එතැන ම මේසය මත වූ කෝටුවක් ගෙන එම කෝටුවෙන් මස් වැදලි අතර තිබුණු යමක් ඉවතට ගෙන යෙරොජ් දෙසට දික් කළේ ය.

"මහපොට ඇඟිල්ලක කොටසක් යෙරාජ්... මේක සතෙක්ට අයිති එකක් නෙමෙයි.. මේක මිනිස් ඇඟිල්ලක කොටසක්" පියතුමා එසේ කියත් ම යෙරාජ් "මොකක්" යැයි පුදුමයෙන් පවසමින් කඩිනමින් ඔහුගේ අත් වැසුම් පැලඳ ගත්තේ ය. ඉන්පසුව පියතුමා ඔහු ඉදිරියට දික් කළ කෝට්ට අතට ගත් ඔහු එහි එල්ලෙමින් තිබුණ 'ඇඟිල්ලක කොටස' දෙස දෑස් කුඩා කර බැලුවේ ය. එය මහපොට ඇඟිල්ලක උඩු කොටස යි. එහි නියපොත්ත කිසියම් හේතුවක් නිසාවෙන් කැඩී ගොස් තිබුණත්, එය නිසැකව ම මහපොට ඇඟිල්ලක් යැයි ප්‍රත්‍යක්ෂ කරගත් යෙරාජ් ඒ මොහොතේ ම ඔහුගේ දුරකතනයට දෑත් යැවුවේ ය. ඔහු සිතුවේ ෆොරෙන්සික් එකට ඇමතුමක් ගෙන ඉක්මනින් ම ඔවුන් ව මෙම ස්ථානයට ගෙන්වීමට ය. එහෙත් පියතුමා ඔහුව නවත්වා ගත්තේ ය.

"එපා ඕජා" ඔහු කීවේ ය.

"දැනටමත් කෙයිලාවලට අවනම්බුවක් වෙලා ඉවරයි, මේකත් ප්‍රවෘත්ති පත්තරකාරයින් අතට ගියොත් ඊටත් වඩා නවනින්ගිරාවක් වෙයි. විශේෂයෙන් ම... මගේ දේවස්ථානයට" කී පියතුමා ඔහුගේ පපුවෙහි කුරුස සලකුණ සටහන් කොට යෙරාජ් දෙස ගැඹුරු බැල්මකින් බැලුවේ ය.

"ඒක වෙන්න දෙන්න එපා... පුළුවන් නම් ඔය ගැන පරීක්ෂණ මෙහෙයවීම වෙන විදියකට කරන්න" යැයි පවසා එතැන මේසය මත තිබුණු ඉටි බෑගයක් යෙරාජ් වෙත දික් කළේ ය.

යෙරජ්ට පියතුමා කී දෙය වැටහිණි. කෙයිලාව ක්‍රිස්තියානි බැතිමතුන්ගෙන් පිරුණු පෙදෙසකි. මෙහි වසර ගණනකින් අපරාධයක් තියා කුඩා සොරකමක්වත් සිදුවී නොමැත. එවන් පෙදෙසක් කපා වෙන් වී ගිය අතකින් ඇවිස්සී ගියාක් මෙන් මස් පිඟානකින් හමුවූ ඇඟිල්ලකින් ද ඇවිළුණ හොත්, එය මෙම පෙදෙසටවත් එහි පදිංචිව සිටින අයටවත් හොඳකට හිටින්නේ නැත. හැරත් එම ඇඟිල්ල එස්ටෝනියාවේ ආදිතම දේවස්ථානයකින් හමුවූ බැව් පැතිර ගිය හොත්, එය මෙම සිද්ධස්ථානයටත් සිදුවන අවනම්බුවකි.

"හොඳයි පියතුමා.. මම මේක වෙන විදියකට කරන්නම්" කී යෙරාජ් පියතුමා දික් කළ ඉටි බෑගයට කෝටුවෙන් අල්වාගෙන සිටි ඇඟිල්ලක කොටසත්, එතැන බිම තිබුණු මස් පිඟානත් දමා ගත්තේ ය. ඉන්පසුව පියතුමා දෙසට හැරුණු ඔහු පියතුමාට ආචාර කොට කාමරයෙන් පිටතට ආවේ ය.

ඒ එන ගමන් ඔහු මෙසේ ඇසුවේ ය.

"පියතුමා කොහෙන්ද මේ මස් ගත්තේ?"

"පල්ලියෙන් පල්ලෙහාට යද්දි හමුවෙන මුල් ම මස් කඩේ" කී පියතුමා මඳක් නතර වී සුවී දෙසත් යෙරාජ් දෙසත් නිහඬව බැලුවේ ය.

"ඕජා... ඒක මිනිස්සුන්ට මස් සපයන කඩයක්. ඒ නිසා මේ ආරංචිය ගැන බොහෝම පරිස්සමින් කටයුතු කරන්න ඕන. මේක පිටට ආරංචි වුණොත් මම

කලින් කිවුවා වගේ ම කෙයිලාවට ලොකු අවනම්බුවක් වෙන්න පුළුවන්"

"එතකොට පියතුමා මේක ගත්තේ කවද්ද?"

"ඊයේ.... ඊයේ දහවල් තුනට විතර. ඒ කඩේ ඉන්නවා "නකුබී" කියලා ග්‍රීක මනුස්සයෙක්. ඒ උන්දෑ මාව දන්නවා. මම මස් ගනිද්දි ඒ මනුස්සයා ලූනටත් අහක දාන මස් පොඩ්ඩක් බෑග් එකකට දාල දෙනවා. ඔය ඇඟිල්ල තිබ්බේ ඒකේ"

"එතකොට පියතුමාට ලැබුණු මස් බෑගය" යෙරාජ් ඇසීය. එවිට පියතුමා එතැන මේසය මතට ඇඟිල්ල දිගු කළේ ය.

ඔහු එම මස් බෑගය මේසය උඩ ඇති හිම පිරවූ භාජනයක ගිල්වා ඇත. යෙරාජ් එයත් එම භාජනයෙන් ඉවතට ගෙන විවෘත කොට බැලීය. එහි ඇත්තේ හොඳින් පොඩි කරන ලද මස් කැබලි ය. ඒවා කුමන වර්ගයේ මාංශයක් දැයි ඒ දෙස බැලූ බැල්මට සොයා ගැනීමට හැකියාවක් නැත.

"මම මේ දෙක ම මගේ මිත්‍රයෙක්ගේ මාර්ගයෙන් පරීක්ෂා කරන්නම්" ඔහු ඒ දෙස බලන ගමන් පියතුමාට කීයෙන් පියතුමා සුසුමක් හෙළා එය අනුමත කළේ ය.

"මේක දෙවියන්ගේ නගරය ඕජා. දෙවියන් වහන්සේ මේ හැමදේම විසඳයි" කී ඔහු තම පපුවේ කුරුසය සලකුණු කොට යෙරාජ්ගේ නළලතත් කුරුසය සටහන් කළේ ය. ඉන්පසුව ඔහු සුවී දෙසට හැරුණේ ය.

"ඔබතුමිය පිනි මුවන්ගෙන් ඈත් වෙලා ඉන්න. උන් ගර්භනී මව්වරුන්ට කැමති නැහැ. දැන් ශීත කාලය නිසා පිනි මුවන් හැම තැන ම..." ඔහු කීවේ ය.



13

යෙරාජ් යළිත් කාරයට විත් හිඳගත්තේ ය. ඔහුගේ අතේ වූ පොලිතින් මලු දෙක ඩෑෂ් බෝඩය මත තැබූ ඔහු සුවී දෙස බැල්මක් හෙළී ය. ඇය සිටින්නේ කුමක් හෝ ගැඹුරු කල්පනාවක ය. එසේ කල්පනා කරන ගමන් ඇය තම කුසත් අල්වාගෙන කුමක් හෝ මුමුනයි.

"සුවී" යෙරාජ් ඇයට කතා කළේ ය. එහෙත් ඇයට එය ඇසුණේ නැත.

"සුවී" ඔහු මඳක් ශබ්දයෙන් කීවේ ය. එවිට සුවීව ගැස්සී ගියෙන් ඇය ක්ෂණික බැල්මකින් යෙරාජ් දෙස බැලුවා ය.

"මොකක්ද වෙලා තියෙන්නේ"

"නැහැ" යි කියන්නට මෙන් හිස දෙපසට වැනූ සුවී ජනේලයෙන් පිටත බලාගත්තා ය.

ඒ බලද්දි ඇයගේ දෑස එක එල්ලේ ම රැඳුණේ පියතුමා දෙසටයි. ඔහු දොර අසල හිටගෙන තමන් දෙස ගැඹුරු බැල්මකින් බලාගෙන සිටියි.

ඔවුන් එතැනින් නික්ම පියතුමා විසින් පැවසූ පල්ලියට පහතින් ඇති ප්‍රධාන මාර්ගයේ වූ පළමු මස් කඩය අසල නතර විය. එය කඩ පේළියක් අතර මැද තිබුණු රතු ගල් බිත්තියකින් බැඳ ඇති කුඩා කඩයකි. එම කඩය මුදුනේ "ග්‍රීක මස්" යනුවෙන් පුවරුවක් ගසා ඇත. එය දකිත් ම යෙරාජ්ගේ මුහුණින් යාන්තම් සිනහවක් නික්ම ආවේ ය.

"ග්‍රීක මිනි මස්" සෙමෙන් කෙඳුරු ඔහු කාරයෙන් බැස මස් කඩය දෙසට ඇවිදින්නට විය.

කලින් කීවාක් මෙන් මෙය රතු පැහැ ගල් බිත්තියකින් බැඳ ඇති කඩයකි. එහි පිටත සේ ම කඩයෙහි ඇතුළත බිත්තිත් රතු පැහැ තීන්තෙන් පාට කර තිබුණෙන් එයින් නිරූපණය වූයේ

"නියම මස් කඩයක" ස්වරූපයකි. එහි ඉදිරිපස වීදුරුව අසල ම පිටතට පෙනෙන ආකාරයෙන් ගවයන් සහා ඌරන්ගේ මස් කඳන් එක දිගට එල්ලා ඇත. ඒවා දෙසත් බලමින් යෙරාජ් කඩය තුළට ඇතුළු විය. ඔහු සහ සුවී කඩයේ දොර විවර කරත් ම කඩය තුළ සිටි තරුණ සේවිකාවක් ඔවුන් දෙස පුදුමයෙන් මෙන් බලා සිනහවක් පෑවා ය. යෙරාජ් ඇය දෙසත්, ඇයට විරුද්ධ පසින් මස් කපමින් සිටි පිරිමියා දෙසත් බැලුවේ ය. ඔවුන් දෙදෙනා හැරෙන්නට මෙම

කඩය තුළ වෙන කිසිවකුත් නැත. තරුණිය එම කඩයේ සේවිකාව විය යුතු ය. පිරිමියා....?

ඔහු ඒ දෙසට හැරිණි. ඔහු සුදු පැහැ පොලිතින් ආවරණයක් පැලඳ සිටි අතර එම ආවරණය රුධිරය විසිවීමෙන් මුළුමනින් ම පාහේ රක්ත වර්ණයට හැරී ඇත. යෙරාජ් කඩයට ඇතුළුව තමන් දෙස බලද්දී ඔහු තම අතෙහි වූ පිහිය පැත්තකින් දමා ඉටිකොළ ඒප්‍රනයෙන් ම දෑත් පිහදගෙන යෙරාජ් ඉදිරියට ආවේ ය.

"මහත්මයා මොනවද ඕන?" ඔහු යෙරාජ් දෙස බලා විමසුවේ ය.

"නකුබී" යෙරාජ් ඇසීය.

"මම" ඔහු පිළිතුරු දුන්නේ ය.

යෙරාජ් ඔහුගේ දෑස් දෙස විමසිලිමත්ව බැලීය. ඒවායේ භීතියක් හෝ තැති ගැන්මක් නැත. ඔහුට ඇත්තේ කුඩා දෑසක් සහ රවුම් තරබාරු මුහුණකි. ඔහුගේ ශරීරයත් මුහුණ මෙන් ම තරබාරු එකක් වූ අතර ඔහු තම දෑත ඒප්‍රනයෙන් පිසදමමින් යෙරාජ් ඉදිරියේ හිටගත්තේ ය. යෙරාජ් කඩය ඇතුළත තවත් කාමරයක් හෝ පුද්ගලිකව කතා කළ හැකි තැනක් ඇත්දැයි බැලීමට එහි වීදුරු රාක්කවලට පිටුපසින් ඇති කුඩා කොරිඩෝව දෙසට දෑස් යොමු කළේ ය. එහි කුඩා දොරවල් දෙකක් පමණක් ඇත.

ඔහු තමා ඉදිරියේ සිටි පුද්ගලයාව නොතකා කඩයෙන් පිටුපස කොටසට ඇවිද ගොස් එහි වූ දොරවල් දෙක විවර කොට බැලීය. එයින් එකක් කඩයේ ශීතකරණය වූ අතර අනෙක් දොර වැසිකිලියට විවර විය. එපමණකි, කඩය තුළ මස් පොඩිකරන ස්ථානයක් හෝ මැෂිමක් හෝ නැත.

"දොර වහන්න" ඔහු කොරිඩෝවෙන් පිටතට එන අතර ම සුවී දෙස බලා කීවෙන් සුවී මස් කඩයට ඇතුල් වෙන දොර වසා දැම්මා ය. යෙරාජ් සුවී අසලට ගොස් ඇය අතේ වූ මස් බෑග් දෙක ගෙනැවිත් එය වීදුරු මේසය මතට අත හැරියේ ය.

"ෆර්ඩෝ පියතුමාගේ මස් බෑගයට ඇඟිල්ලක් ආවේ කොහොමද?" ඔහු සෘජු බැල්මකින් තරබාරු තැනැත්තාගෙන් ඇසුවේ ය. එම ප්‍රශ්නයෙන් ඔහුගේ තරබාරු මුහුණ හැකිළී ගියේ ය.

"මොකක්ද? මොන ඇඟිල්ලක් ද?" ඔහු වික්ෂිප්ත ව ඇසුවේ ය.

යෙරාජ් ඒ මොහොතෙම ඔහු වීදුරුව මතට අත්හල එක් බෑගයක් ඉහළට ඔසවා ඔහුට පෙන්නුවේ ය.

"මේ ඇඟිල්ල"

ඔහු එය පෙන්වද්දි තරබාරු තැනැත්තා යෙරාජ් පෙන්වන දෙය හොඳාකාරව ම දැකගන්නට මෙන් දෑස් ඒ අසලට ම ළං කළේ ය. ඔවුන් අසල සිටි

තරුණියත් එම බෑගය දෙස බැලීමට ඔවුන් ඉදිරියට ආවා ය.

"ම්ම්ම් මේක .... " නකුබී නමින් හැඳින්වූ එම ග්‍රීක ජාතිකයා කුමක් කියන්න දැයි නොදන්නා ලීලාවෙන් තෙපළුවේ ය. ඔහුගේ මුවින් වචනය එළියට ආවේ නැත. එසේ නැතහොත් ඇඟිල්ල දෙස බලාගෙන ඔහු කටට ආ දේ ගිල ගත්තේ ය. ඒ කෙසේ මුත් ඔහුගේ මුහුණේ ඇත්තේ ප්‍රශ්නාර්ථයකි.

"ඔව්...මේක... මේ ඇඟිල්ල තිබුණේ තමුන් ෆර්ඩෝ පියතුමාගේ බල්ලට දුන්නු මස් බෑගයේ" කී යෙරාජ් එම පොලිතින් බෑගය යළිත් සුවී අතට දී තරුණ සේවිකාව දෙසට හැරිණ.

"කොහෙන්ද මේ ඇඟිල්ල මස්වලට ආවේ?" ඔහු ඇය දෙස බලාගෙන ගෙරවූවේ ය.

"දන්නෑ මහත්මයා... අපි මෙතැන කරන්නේ මස් විකුණන එක විතරයි... අපිට මස් ගෙනත් දෙන්නේ ලාගෝවල තියෙන මස් ගබඩාවකින්" කී ඇය තම මේසය දෙසට දිව ගොස් එහි පොතක් ඇතුළත වූ කුඩා කාඩ් පතක් ගෙන ආවා ය.

"මේ තියෙන්නේ... මේක... " කී ඇය එය යෙරාජ්ට දික් කළෙන් යෙරාජ් කාඩ් පත අතට ගෙන එය දෙස බැලීය.

"ලෝගෝ මස්" එම කාඩ් පතෙහි ලොකු අකුරින් ලියා ඇත.

"එතකොට තමුන් පියතුමාගේ බල්ලට දුන්නු මස් පාර්සලය. ඒක කොහෙන් ගත්තු එකක් ද?"

"මහත්මයා ඒක" තරබාරු තැනැත්තා පිළිතුරු දෙන්නට විය. ඔහු ග්‍රීක ජාතිකයකු වූ නිසාවෙන් ඔහුගේ එස්ටෝනියානු වචනවල ඇත්තේ වෙනස් උච්චාරණයකි.

"ඒකත් එන්නේ ලෝගෝවලින් ම යි. ඒත් ඒ මස් අපිට නොමිලේ ලැබෙන ඒවා. ලෝගෝවලින් සත්තුන්ට දාන්නත් මස් බෙදනවා... අපේ ඇණවුම් විශාල ඒවා නිසා ඔවුන් සත්තුන්ට දාන මස් දෙන්නේ කිසිම ගාණක් අය නොකර" ඔහු එසේ කියද්දි යෙරාජ් කඩය තුළ ඇති මස් පිරවූ වීදුරු අල්මාරි දෙස බැරෑරුම් බැල්මකින් බැලුවේ ය.

"කෝ ඒ සත්තුන්ට දාන මස්?" ඔහු ඇසීය.

"මෙතැන මහත්මයා" තරුණිය ඇය හිටගෙන සිටි තැන ම වූ දිගු වීදුරු රාක්කය කෙළවරෙහි ම වූ මස් භාජනය පෙන්වමින් කීවා ය. යෙරාජ් ඒ දෙසට ළං ව එබී බැලුවේ ය.

එම මස්, තරමක් විශාල කැබැලිවලට පොඩි කර තිබුණු ඒවා වූ අතර සාමාන්‍ය මස්වලට වඩා වෙනසක් එහි නොවී ය. ඒවා කුමන වර්ගයක මස් දැයි පියවි ඇසින් හඳුනා ගත නොහැක. මාංශයන් පොඩි කළ පසුව ඒවා සියල්ල

ම එක ම ආකාරයට පෙනෙන බැවින් මේවා වෙන්කර හඳුනාගත හැක්කේ පරීක්ෂණාගාරයක් තුළ දී පමණි. ඒ දෙසත්, කඩයේ සිටි ග්‍රීක ජාතිකයා සහ තරුණිය දෙසත් බලාගෙන මොහොතක් කල්පනා කළ යෙරාජ් ඒ මොහොතේ ම තීරණයකට එළැඹිණි.

'බොහෝ දුරට සත්වයින්ට දීමට රැගෙන ආ මස්වල පමණක් මිනිස් මාංශ අඩංගුව තිබිය හැකි ය. එහෙත් එය අවිනිශ්චිත ය. යම් හෙයකින් මිනිසුන්ට විකුණනු ලැබූ මස්වලත් මිනිස් මාංශ කලවම් වී තිබුණොත් එය මුළු කෙයිලාව ම කලබලයට පත්වන පුවතක් වනු ඇත. දැන් කිරීමට ඇත්තේ එක දෙයකි. හැකි ඉක්මනින් ම මෙම කඩයේ ඇති සියලුම මාංශ පරීක්ෂාවට ලක් කළ යුතු ය. ඒ සඳහා යොදාගන්නාවූ නිලධාරීන් ද පුද්ගලිකව මෙම කාර්යය සඳහා යොදා ගත යුතු ය. කඩය තුළ රස පරීක්ෂණයක් සිදුවන බවට කිසිවකුත් දැන ගත යුතු නැත. සේරමට වඩා මෙම මස් අලෙවි සැල මෙතැන් සිට වසා දැමිය යුතු ය.'

යෙරාජ් එම තීරණයත් සමඟ වහා ම ක්‍රියාත්මක විය. ඔහු ටාලීන්වල තම හිතවත් රස පරීක්ෂක නිලධාරියකුට ඇමතුමක් ලබා දී වහා ම කෙයිලාවලට එන ලෙසත්, තමන්ට මෙම පරීක්ෂණය සඳහා පුද්ගලිකව සහය වන ලෙසත් ඉල්ලා සිටි අතර, ඒ මොහොතේ සිට මෙහි පරීක්ෂණ අවසන් වනතුරු කඩය වසා තබන්නැ'යි එහි හිමිකරු වූ ග්‍රීක ජාතිකයාට අණ කළේ ය. සිදුවී ඇති සියල්ල ම ග්‍රීක ජාතිකයාට පැහැදිලි කර දුන් යෙරාජ් ඔහුගේ අලෙවිසැලේ මස්වලට කුමන ආකාරයකින් හෝ මිනිස් මාංශ කලවම් වී ඇති බවත්, මෙය පිටතට ආරංචි වුවහොත් ඔහුට මෙන් ම කඩයටත් අනතුරක් සිදුවිය හැකි බවත් පවසා මෙම පරීක්ෂණය සිදුවන තුරු කඩය වසා දමන ලෙසත්, ඔහුගේ අණට සහ විධානයන්ට කීකරුව ක්‍රියා කරන ලෙසත් ඉල්ලා සිටියේ ය. ග්‍රීක ජාතිකයා ඊට එකඟ විය. ඒ මොහොතේ තරුණියගේ දෑසින් කඳුළු කඩා පැන්නා ය.

"අනේ මහත්මයා අපිව බේරගන්න" ඇය යෙරාජ්ගෙන් ඉල්ලා සිටියා ය. "අපි මේ කිසි දෙයක් ගැන දන්නෑ, අපි කරන්නේ ලොගෝවලින් ලැබෙන මස් කෙයිලාවල විකුණන එක විතරයි... අපි ළඟ අඩු ම තරමින් මස් අඹරන මැෂිමක්වත් නැහැ... මේ සේරම අපිට ලෝගෝවලින් ලැබුණ ඒවා" ඇය කඩය වටා වූ වීදුරු අල්මාරි පෙන්වමින් කීවා ය. ඒත් සමඟ ම තරබාරු ග්‍රීක ජාතිකයා ඇය අසලට විත් ඈ සංසුන් කිරීමට මෙන් ඇයව වැලඳ ගත්තේ ය. ඔහු පැලඳ සිටි රුධිරය පිරුණු ඒප්‍රනයට ම ඈ තුරුලු විය. ඒ දෙස බලා සිටි සුවී දෑසත් කුඩා කරගෙන ඇයගෙන් මෙසේ ඇසුවා ය.

"මේ තමුන්ගේ කවුද?"

"මේ මගේ සැමියා, එයා ග්‍රීසියේ ඉඳන් එස්ටෝනියාවට ආවේ මම හින්දා" ඇය කීවා ය.

ඇය එය පවසත් ම යෙරාජ්ගේ උඩු සාක්කුවෙහි අටවා තිබුණු පොලිස්

වෝකිටෝකියෙන් හඬක් නැගෙන්නට විය. යෙරාජ් එය අතට ගෙන එය ඔහුගේ කට ළඟට ළං කර ගත්තේ ය.

"කැප්ටන් යෙරාජ්" එයින් ආවේ අර්වෙඩ්ගේ කටහඬ යි.

"ඔව් අර්වෙඩ්?"

"කැප්ටන් අපිට අර කොර්විරාප්වලින් හමුවුණ අත"

"ඉතින්?"

"ඒකෙ ඩී. එන්. ඒ රිපෝට් එක ආවා"

මෙය කුඩා ප්‍රමාණයේ කඩයක් වූයෙන් වෝකිටෝකියෙන් ආ හඬ එතැන සිටි හැමෝටම ඇසෙන්නට විය. යෙරාජ් ඉදිරියේ සිටි ග්‍රීක ජාතිකයා සහ තරුණියගේ දෑස් ද යෙරාජ් දෙසට ම යාවී තිබුණු අතර, අර්වෙඩ් අත ගැන පවසත් ම සුවී ද යෙරාජ් අසලට ළං වූවා ය.

"අර්වෙඩ්, රිපෝට් එක මගේ මේසය උඩින් තියන්න. මම දැන් කාර්යාලයට එනවා" යෙරාජ් එය විසංධි කිරීමේ අදහසින් ඔහුට පැවසුවේ ය. ඇරත් සැකකරුවන් දෙදෙනකු ඉදිරියේ 'කපා වෙන් කළ අත' ගැන කතා කිරීමට යෙරාජ්ට උවමනාවක් නොවී ය.

නමුත් අර්වෙඩ් නවතින පාටක් පෙනෙන්නට ද නැත.

"කැප්ටන් කැප්ටන්.... " ඔහු යළිත් කීවේ ය.

යෙරාජ් නළලත් රැලිකර ගනිමින් කඩයේ දොර දෙසට හැරිණ.

"කැප්ටන්, ඒ අත මහලු කාන්තාවකගේ අතක් වයස අවුරුදු හැටත්, හැත්තෑවත් අතර, ඒ වගේ ම එහි තවත් කාන්තාවකගේ රුධිරය තිබී තියෙනවා. ඇය මීට මාස හතරකට කලින් ටාලීන්වලින් අතුරුදහන් වූ කෙල්ලෙක්, ග්‍රීක සම්භවයක් තියෙන කෙනෙක්"

අර්වෙඩ් එසේ කියත් ම දොර දෙසට හැරුණු යෙරාජ්ව ඉබේ ම අනිත් පසට හැරිණි. ඔහුගේ දෑස තමා ඉදිරියේ සිටි ග්‍රීක ජාතිකයාට එක එල්ලේ ම යා විය.

"ග්‍රීක සම්භවයක් කියල ද කිවුවේ?" යෙරාජ් ඇසුවේ ය.

"ඔව් කැප්ටන්, ඒක රිපෝට් එකේ පැහැදිලිව ම ලියලා තියෙනවා... මේ කෙල්ල ග්‍රීක සම්භවයක් තියෙන කෙල්ලෙක්"

අර්වෙඩ් පවසත් ම යෙරාජ් තම වෝකිටෝකිය විසංධි කොට ඔහු ඉදිරියේ සිටි ග්‍රීක ජාතිකයා දෙස විමසිලිමත් බැල්මක් හෙළී ය. එම බැල්ම ඔහු අසල ම සිටි තරුණිය හොඳින් හඳුනාගන්නට ඇත.

"මහත්මයා.. මේක වැරදීමක්, මගේ සැමියා මේ කිසිම දේකට සම්බන්ධ කෙනෙක් නෙමේ"

"වෙන්න පුළුවන්" යෙරාජ් කීවේ ය. "ඒත් අපිට සිද්ද වෙනවා ඔබේ සැමියව පොලිස් ස්ථානයට රැගෙන යන්න; අපිට ඔහුගෙන් කට උත්තරයක් ගැනීමට අවශ්‍යයි. ඒ වගේ ම ඇඟිලි සලකුණුත්" කී ඔහු සුවී දෙසට හැරුණේ ය. ඔහු විසින් සුවීට දුන් මස් බෑග් දෙක තවමත් ඇයගේ අතේ ඇත.

"සුවී, ඔයා ලෝගෝවලට යන්න" එසේ පැවසූ ඔහු ඇයට ළං ව මෙසේ ද කීවේ ය.

"දෙයියන්ගේ නාමෙන් මට මේක ඉවරයක් දකින්න ඕනේ"

ඒ වචනයෙන් සුවීගේ රවුම් දෑස් ලොකු විය.

"හරි කැප්ටන්" ඇය තම ප්‍රධානියාට ආචාර කොට එතැනින් නික්මුණා ය.



14

කැප්ටන් යෙරාජ් 'නකුබී' නමින් හැඳින්වූ එම ග්‍රීක ජාතිකයාව පොලිසියට රැගෙන යන අතර සුවී එතැන ම වූ මාර්ගයට විත් කුලී රථයක් නවත්වා ගත්තා ය. ඇය කුලී රථයේ පිටුපස ආසනයට ගොඩ වී එහි ඉදිරිපස රියැදුරු අසුනේ සිටි කොලුවාට "ලෝගෝවලට" යැයි කීවෙන් ඔහු රථය පණගංවා ගත්තේ ය.

සුවී ඇයගේ අතේ වූ මස් පිරවූ බෑග් දෙක ආසනය මත ම තැබීය. ඇයගේ කුසට තට්ටු කරන ගමන් ආසනයට හොඳින් බර ව හිස තබා ගත්තා ය.

"පිපී..... මම හිතන්නේ අර ග්‍රීක මනුස්සයට මේකේ කිසිම සම්බන්ධයක් නැහැ.. ඒත් දෛවය හරි පුදුමයි පිපී, දෛවයට පුළුවන් කිසිම සම්බන්ධයක් නැති දේක වුණත් සම්බන්ධයක් ඇති කරන්න. සමහරක් වෙලාවට එහෙම සම්බන්ධයක් ඇති කරලා ඒ මනුස්සයව නැති කරල ම දාන්න වුණත් දෛවයට පුළුවන්."

ඇය මුමුනන ගමන් සිහින් සිනහවක් පෑවා ය. ඒත් සමඟ කාරයේ රියැදුරා උඩු දර්පණයෙන් ඈ දෙස බලනු දුටු සුවී ඔහුට කතා කරන්නට පටන් ගත්තා ය.

"මනුස්සයෝ කෙළින් බලාගෙන යනවා" ඇය කීවා ය.

"පිනි මුවන් පාර පනින්න පුළුවන්, උන්ව ඈත දි ම දැක්කොත් වාහනේ නවත්වනවා... උන් ළඟට යන්න ඕන නැහැ" කී ඇය ඔහුට නොඇසෙන්නට මෙසේ ද කීවා ය.

"කොහොමත් උන්ගෙ ඇස් අමුතුයි... උන් කතා කරන්නේ රහස් හංගගෙන."

පිනි මුවන් ගැන මීට පෙර ඇයගේ සිතේ අහිතක් තිබුණේ නැත. එහෙත් පියතුමාගේ කතාවෙන් පසුව ඇය ඒ ගැන හිතන්නට පටන්ගෙන තිබුණි. කාන්තාවකගේ මනස වැඩ කරන්නේ හරි ම ගුප්ත ආකාරයෙනි. සුවීගේ පැත්තෙන් බැලූ විට එය සරල ය.

පිනි මුවන් ගර්භනී කාන්තාවනට කැමති නැත.

සුවී ගර්භනී කාන්තාවකි.

ඒ නිසා සුවී පිනි මුවන්ට කැමති නැත.

15

කුලී රථය කෙයිලාවේ කුඩා ග්‍රාමීය පෙදෙසක් වූ වාල්ස්වලට ආසන්නයේ පිහිටි ලෝගෝවලට ආසන්න විය. ලෝගෝ කෙයිලාවලට වඩා උස් බිමක පිහිටා තිබුණෙන් එහි ශීතල අධික ය. විශේෂයෙන් ම, නොවැම්බර් මාසයේ දී ලෝගෝවල ඇත්තේ දරුණු ශීතලකි. මෙම ශීත කාලගුණය නිසාවෙන් ටාලීන්ට යාබද අනිකුත් ගම්මානවලට වඩා ලෝගෝවට ඉක්මනින් ම හිම වැටීම ද ආරම්භ වෙයි. සුවී ලෝගෝ කරා ගමන් ගත් මෙම දිනයත් එවන් දිනයක් වූ අතර වාහනය ලෝගෝ ප්‍රදේශයට අවතීර්ණ වෙත් ම ඇද වැටුණු හිම වරුෂාවෙන් මුළු පෙදෙස ම වැසී යන්නට විය. රියැදුරා තම කාරයේ වයිපරය ක්‍රියාත්මක කරමින් එම වරුෂාවට දෙස් තියන්නට පටන් ගත්තේ ය.

"කාලකණ්ණි හිම වැස්ස, හැම අවුරුද්දෙ ම මෙහෙමයි" ඔහු කීවේ ය. එහෙත් සුවීට එම ඇනුම් පදය ගැන නොරිස්සීමක් ඇති විය.

"ඒයි සහෝදරයා" ඇය පිටුපස ආසනයේ සිට ඔහුට ඇසෙන්නට කෑ ගැසුවා ය. "තමුන් මොකොට ද ඔය බනින්නේ" ඈ ඇසුවා ය.

"හිම වැස්සට නෝනා.... මේක මහා කාලකණ්ණි හිම වැස්සක්. ආ... එහෙම නෙමෙයි ද?"

"නැහැ එහෙම නෙමෙයි" සුවී එය ප්‍රතික්ෂේප කළා ය.

"තමුන් දන්නව ද තමුන්ට ගිම්හාන කාලෙට බොන්න වතුර ලැබෙන්නේ කොහොමද කියලා?" ඇය තරුණයාගෙන් ඇසුවා ය.

සුවීගේ එම ප්‍රශ්නයෙන් ඔහුගේ මුහුණ කල්පනාවකින් බරවී ගිය මුත් එයට දීමට තරම් පිළිතුරක් ඔහු දැන සිටියේ නැත. ඔහුගේ නිහඬබාවය හමුවේ සුවී යළි කතා කළා ය.

"තමුන් දන්නැත්නම් දැනගන්නවා, තමුන් ඔය කාලකණ්ණි වැස්ස කියලා දෙස් තියපු මේ හිම වරුසාව නිසා තමයි තමුන්ට ගිම්හාන කාලයට බොන්න වතුර ලැබෙන්නේ. එහෙම නොවුණ නම් තමුන්ටයි, මේ ගම්මානයේ මිනිස්සුන්ටයි සිද්ද වෙන්නේ වතුර නැති ව මැරිලා යන්න" කී ඇය ආසනයේ තිබුණු මස් බෑග් දෙක අතට ගෙන ජනේලයෙන් පිටතට දෑස් එබීය.

හිම වැස්ස නිසා මාර්ගය මීදුමෙන් බරවී ඇත. තවත් ස්වල්ප වෙලාවකින් ම මුළු මාවත ම මීදුමෙන් බොඳවී යනු ඇතැ'යි සුවීට සිතුණි. ඒ නිසා ම ඇය කාඩ් පතෙහි සඳහන් ව තිබුණු ලෝගෝ මස් ගබඩාව විපරම් කරන්නට පටන් ගත්තා ය.

"ලෝගෝ මස් ගබඩාව කොහේද තියෙන්නේ" ඒ සොයන ගමන් ඈ කොලුවාගෙන් ඇසී ය.

"ඔය ඉස්සරහ ම... පාර මීදුමෙන් බොඳ වෙලා ගිහින් නැත්නම් අපිට විනාඩි පහෙන් එතැනට යන්න තිබුණා. ඒත් දැන්නම් නෝනට ඊට වඩා වෙලාවක් ඉවසන්න වෙනවා" කී රියැදුරා වාහනයේ වේගය තවත් ටිකක් අඩාල කළේ ය. ඔහු තවමත් සුවී කී දෙය සිතන බැව් ඔහුගේ මුහුණින් පෙනිණි.

"එතකොට නෝනා හිමෙන් කොහොමද ගිම්හාන කාලයට බොන්න වතුර ලැබෙන්නේ" ඔහු ඇසුවේ ය.

ඒ ප්‍රශ්නයට සුවීගේ මුහුණ ආඩම්බර සිනහවකින් පිරී යන්නට විය.

"ගොනෙක්" ඇය පිපීට ඇහෙන්නට එම සිනහවත් සමඟ මුමුනා රියැදුරාට බොහෝ ම සංසුන්ව මෙසේ කීවා ය.

"සහෝදරයා... ඔබ රියැදුරකුත් මම පොලිස් නිලධාරිනියක් වීම ගැනත් කතා කරනවා නොවෙයි. එහෙත් ඔබ මේක නොදන්න එක ගැන පුදුමයි. තමුන්ලා රියැදුරු වෘත්තිය ගැන දන්නවා වගේ ම මේ වගේ පොඩි දේවල් ගැනත් දැන ගන්න ඕන. ආ ඊට කලින් කියනවා, තමුන් දැනගෙන හිටිය ද පිනි මුවන් බඩදරු අම්මලාට අකමැති විත්තිය"

"නැහැනේ" රියැදුරා හිසත් දෙපසට වනමින් බයාදු ස්වරූපයෙන් කීවේ ය.

"අන්න ඒකයි... එතකොට දැන් මේ ප්‍රශ්නේ, බලනවා සහෝදරයා මේකට උත්තරේ හරි ම සරලයි. තමුන් කවදාවත් දැකලා තියෙනව ද එස්ටෝනියාවට ධාරානිපාත වැස්ස කඩා පාත් වෙනවා?"

"ඔව් නෝනා සිසිර සහ සරත් කාලවලට එහෙම වැසි වැටෙනවා" ඔහුගේ පිළිතුරෙන් සුවීගේ මුහුණ හාස්‍යයෙන් පිරිණි.

"නැහැ... ඔබ ඒ කියන්නේ ධාරානිපාත වරුෂාව ගැන නෙමෙයි. සෘතු වෙනස් වෙද්දි වහින වැස්ස ගැන. ධාරානිපාත වැස්ස කියන්නේ එක දිගට නොනවත්වා වහින දිගු වැස්සට"

"හ්ම්" රියැදුරා මිමුනුවේ ය.

"ඉතින් එහෙම වැස්සක් නොවැටී අපේ පාර්නුවට (එස්ටෝනියාවේ විශාලතම ගඟ) වතුර පිරෙන්නේ කොහොමද? අපේ පොළවට වතුර උරන්නේ කොහොමද? ගස්කොළන් ජීවත් වෙන්නේ කොහොමද? මේ එස්ටෝනියාවේ තියෙන බිම් අගල් තෙත් වෙන්නේ කොහොමද? ඒ සේරම වෙන්නේ මේ කාලකණ්ණි හිම වැස්සෙන්, කොටින් ම ගිම්හාන කාලෙට කඳු දිගේ පහළට ගලාගෙන එන දිය ඇළිවලට වතුර කොහෙන්ද? ඒවත් මේ හිම වරුෂාවෙන් ම තමයි. ශීත කාලෙට කඳු මුදුන්වල තැන්පත් වෙන හිම ගිම්හානයේ රස්නයත් එක්ක කඳු මුදුන්වලින් පහතට ගලාගෙන එනවා. ඔබ ඔය දකින දිය ඇලි

බොහෝමයක් හැදිලා තියෙන්නේ ඒ විදියට" කී සුවී තම ජනේලයේ බැඳී තිබුණු හුමාලය අතින් පිස දමමින් මාර්ගය දෙස බැලුවා ය. හිම වැස්ස තවත් දරුණු වෙමින් ඇත. එය දකිත් ම ශීතල හැඟීමකින් ඇයගේ ශරීරයත් කිලිපොළා ගියෙන් ඇය තම හිසේ වූ ලෝම හිස් වැස්ම එක් අතකින් සකසා ගත්තා ය.

"තව කොච්චර දුර ද?" ඇය ඇසුවා ය.

"ටික දුරක් නෝනා, මේ ඉස්සරහ ම"

"ඔය කියන මස් කඩේ මේ ගමේ ප්‍රසිද්ධ එකක් කිවුවා නේද?"

"ඔව් නෝනා... ලෝගෝවල බොහෝ ම ප්‍රසිද්ධ එකක්"

"මොන මස්වලට ද?"

"මොකක්ද නෝනා?"

"නැහැ, මම නිකන් ඇහැවුවේ" කී සුවී බෑග් දෙකත් අතකට ගෙන කුළී රථයෙන් බැසීමට සූදානම් විය.

16

ග්‍රීක ජාතිකයාත් සමඟ පොලිස් ස්ථානයට පැමිණි යෙරාජ් ඔහුව ඇඟිලි සලකුණු ලබා දීම සඳහා කරීනේ වෙත යවා ඔහුගේ කාර්යාල කාමරය වෙත ගියේ ය. එහි මේසය මත ටාලීන් හි ප්‍රධාන රස පරීක්ෂක අංශය විසින් එවන ලද ඩී. එන්. ඒ. වාර්තාව තබා ඇත. එය අතට ගත් ඔහු පුටුවේ හරි බරි ගැහි හිඳගත්තේ ය.

වෙලාව දහවල් තුනට ආසන්න ය. ඔහු එය කියවීමට පටන් ගත්තේ ය. එහි මුල් ම පිටුවෙහි කොර්විරාප් බස්නැවතුමෙන් හමුවූ කපා වෙන් කළ අතෙහි දත්තවල සම්පූර්ණ වාර්තාවක් වූ අතර එම අතෙහි රුධිර වර්ගයේ සිට ඇඟිලි සලකුණු දක්වා සියලුම තොරතුරු එහි අන්තර්ගත විය.

රුධිර වර්ගය : ඕ පොසිටිව්

වයස : අවුරුදු 60 - 70 අතර

කාන්තාවක්

රක්තහීනතාවයෙන් පෙළෙන්නියක්.

එම දත්ත අවසානයට එහි සැසැඳීම දක්වන තීරුවේ,

"මෙහි කිසිදු සැසඳීමක් සාර්ථක නැත. තවදුරටත් පරීක්ෂණ පවත්වමින් ඇත." යන්නෙන් කෙටි සටහනක් යොදා ඇත. එය දකිත් ම යෙරාජ්ගේ මුහුණෙන් කලකිරීමක් පිළිබිඹු විය. ඔහු ඊළඟ පිටුවට ගියේ ය. එහි වූයේ තරුණියගේ ඡායාරූපයකි. එම ඡායාරූප අමුණා තිබුණු දත්ත වාර්තාවේ මෙසේ සටහන් වී තිබිණ.

"බෑගය තුළින් හමුවූ රුධිර පරීක්ෂාවේ දෙවැනි රුධිර වර්ගය"

සැසඳීම - සියයට සියයක් නිවැරදි යි.

නම - ලුතීනා නොයාල්.

වයස - අවුරුදු 28 යි

පදිංචිය - නොම්මර 84, කොල්ස්වී, ටාලීන්

ජාතිකත්වය - ග්‍රීක එස්ටෝනියන්

විශේෂ - 11 ඔක්තොම්බර් 2020, ලුතීනා නොයාල්ගේ දෙමව්පියන් විසින් ඇයගේ අතුරුදහන් වීම ගැන පැමිණිල්ලක් ටාලීන් හි රික්කු පොලිස් ස්ථානයට ලබා දී ඇති අතර, එහි දී පොලිසිය විසින් ලබාගෙන ඇති ලුතීකා නොයාල්ගේ ඩී. එන්. ඒ. වාර්තා සමඟ සියයට සියයක් සැසඳේ."

එය දකිත් ම ෆයිල් කවරයේ අමුණා තිබුණු ඡායාරූපය තම අතට ගත් යෙරාජ් එයත් අතෙහි තබාගෙන මේසය මත වූ දුරකතනයේ අංක කිහිපයක් ඔබන්නට පටන් ගත්තේ ය. ඔහුගේ දෑස ඡායාරූපයට යොමු වී ඇත. ඇය කළු කොණ්ඩයක් සහ දුඹුරු පැහැ දෑසකින් යුත් තරුණ කෙල්ලකි. ඇයගේ මුහුණ තරමක් වටකුරු වූ අතර ඇයගේ බෙල්ලෙහි පිටතට පෙනෙන ආකාරයේ කුඩා උපන් ලපයක් ඇත.

"හෙලෝ, ටාලීන් රුකා පොලිසිය අමතනවා" යෙරාජ්ට එහා පසින් ඇසිණි.

"මම යෙරාජ් ඕජා, කෙයිලා පොලිස් ස්ථානයෙන්, කරුණාකර මෙම ඇමතුම ලුතීනා නොයාල් ගැන පරීක්ෂණ පවත්වපු නිලධාරියාට යොමු කරන්න"

"ලුතීනා නොයාල්" එහා පසින් එම නම යළිත් කියනු යෙරාජ්ට ඇසුණි.

"ඔව්.. මීට මාසෙකට කලින් ටාලීන්වලින් අතුරුදහන් වූ කාන්තාව"

"හරි පොඩ්ඩක් ඉන්න"

ටික මොහොතක නිහැඬියාවක් රැඳුණි. ඒ නිහැඬියාව අතරතුර යෙරාජ් රිසිවරයත් කනෙහි තබාගෙන ම ඔහුගේ පුටුවෙහි සුවපහසු ලෙස හාන්සි විය. එවිට ඔහුගේ හිසට උඩින් ඇති පිනි මුවාගේ අං තට්ටුව ඔහුට මනාව දැකගත හැකි විය. මෙය පොලිස් ස්ථානයේ වසර විස්සකටත් වඩා කාලයක් තිබුණු එකක් නිසාවෙන් මෙය මෙතැනින් ඉවත් කර දැමිය යුතුයි යන හැඟීමක් ද ඒ

සමඟ ම යෙරාජ්ට ඇති විය.

"හෙලෝ... මම ලුතිනන් මාර්ගුස් සෝලා"

"මම කැප්ටන් යෙරාජ් ඕජා, කෙයිලාවලින්"

"ඔව් කැප්ටන්"

"අපිට ලැබුණු ඩී. එන්. ඒ. වාර්තාවේ ටාලීන්වලින් අතුරුදහන් වූ ලුතීනා නොයාල්ගේ දත්ත තිබෙනවා"

යෙරාජ් එසේ කියත් ම එහා පස සිටි නිලධාරියා එයින් පුදුමයට පත් වූ බැව් ඔහුට දැනිණ. ඔහුගේ මුවින් රාවයක් පිටවිය.

"මොකක්, ඔබට ඇයගේ මළ සිරුර හමුවුණා ද?" ඔහු ඇසුවේ ය.

"නැහැ, අපිට ලැබුණේ කපා වෙන් කරපු අතක්. ඒක දැන් ජනප්‍රිය සිද්ධියක් නිසා ටාලින්වලටත් එය ආරංචි වෙලා ඇති" යෙරාජ් හාස්‍යයෙන් යුත් සිනහවකුත් සමඟ පැවසුවේ ය.

"ආ... කෙයිලා හි කපා වෙන්කළ අත" එහා පස ඇමතුමේ සිටි නිලධාරියා ද මඳ හාස්‍යකින් යුතුව කීවේ ය.

"ලුතිනන්, ඒ අතෙන් ලැබුණු දෙවැනි ඩී. එන්. ඒ. වාර්තාවට ලුතීනා නොයාල්ගේ දත්ත ගැළපෙනවා, ඔබට පුළුවන් ද ඇයගේ අතුරුදහන් වීමේ සියලුම පරීක්ෂණ වාර්තා හැකි ඉක්මනින් ම මට එවන්න. අපිට ඒක පරීක්ෂණවලට ප්‍රයෝජනවත් වෙයි. තව එකක් මාර්ගුස්, මේ වාර්තාවල දැක්වෙනවා ඇය ග්‍රීක සම්භවයක් ඇති කාන්තාවක් බව, මේ අතුරුදහන් වීම සම්බන්ධව කිසිවකු හෝ අත් අඩංගුවට ගත්ත ද?"

"නැහැ කැප්ටන්, ඒත් දැන් අපිට හෝඩුවාවක් ලැබිලා තියෙන නිසා මේ පරීක්ෂණ තවත් පහසු වෙයි. මම ඇය සම්බන්ධ සියලුම වාර්තා දැන්ම ම කෙයිලා පොලිස් ස්ථානයට ඊමේල් කරන්නම්... ලුතීනාගේ රුධිරය කෙයිලාවලින් හමුවීම නම් හොඳකට හිටින්න විදියක් නැහැ. ඒ කියන්නේ ඇය තවමත් කෙයිලාවල ජීවත් විය යුතුයි. එහෙම නැත්නම් ඇයගේ සිරුරත් කෙයිලාවලින් ම හමුවිය යුතුයි"

"වෙන්න පුළුවන්, සමහර විට අපි හිතන කිසිම දෙයක් නොවෙන්නත් පුළුවන්, අපි දැනටමත් මේ ගැන හොයන්න පටන් අරන් තියෙන්නේ. හෝඩුවාවක් ලැබුණු විගස ම ඒ ගැන ඔබට දැනුම් දෙන්නම්" කී යෙරාජ් නිලධාරියාට ස්තුති කොට රිසිවරය යළිත් දුරකතනය මත තැබුවේ ය. ඒත් සමඟ ම හිඳ සිටි තැනින් හිටගත් ඔහු කාර්යාලයෙන් පිටතට හිස ඔබා බැලීය.

කරීනේ ග්‍රීක ජාතිකයාගෙන් ඇඟිලි සලකුණු ගනිමින් සිටියි.

"මහත්මයා" යෙරාජ් ඔහු ඉදිරියට යන්නට විය.

"ඇඟිලි සලකුණු දුන්නට පසුව ඔබට යන්න පුළුවන්. හැබැයි මේ පරීක්ෂණ අවසන් වන තෙක් ඔබ කෙයිලාවල රැඳී සිටිය යුතුයි. කෙයිලාවෙන් පිට යනව නම් ඒ ගැන අපිට දැනුම් දීමක් කළ යුතුයි තේරුණා ද?"

"ඔව් මහත්මයා" ඔහු ද එයට එකඟ ව හිස වැනුවේ ය.

17

සුවී සෙප්පේ කුලී රථයෙන් බැස එතැන වූ ගොඩනැගිල්ල ඉදිරියේ හිටගත්තා ය. මෙය තට්ටු දෙකක තරමක් විශාල ගොඩනැගිල්ලකි. හිම පතනයේ දරුණු බව නිසා ම හිම පොකුරු එකට බැඳී සබන් පෙණ මෙන් ආකාශයෙන් මතුවෙමින් පවතියි. සුවී හිම මුහුණට නොවැටෙන්නට නළලට අතක් තබා ගොඩනැගිල්ලේ නාම පුවරුව දෙස බැලුවා ය.

"ලෝගෝ මස් - ඉස්තරම් ම මස්" යනුවෙන් එහි කොටා ඇත. එය දකිත් ම ඇයගේ කම්මුල් පිම්බී යන්නට විය.

"පිපී දැක්කනේ" ඇය නළලට තැබූ අතින් ම කුසට තට්ටුවක් දැමුවා ය.

"ඉස්තරම් ම මස් - මිනී මස්" යැයි මිමිනූ ඇය එම තට්ටුවත් සමඟ ම සීරුවෙන් අඩිය තබමින් ගොඩනැගිල්ල තුළට යන්නට විය. ඇය ඇඳ සිටි කබාය දණහිස් ළඟට දිගු විශාල ලෝම හිම කබායක් වූයෙන් සුවීගේ පෙනුම උස මහත සද්දන්ත යෝධයකු සේ පෙනිණි. ඇයගේ පොලිස් තොප්පිය කඩා වැටුණු හිම පොකුරුවලින් පිරී ගොස් ඇත. ගොඩනැගිල්ලේ දොර අසලට ආ විගස ම ඇය තොප්පිය අතට ගෙන එය ගසා දැමුවා ය. ඒත් සමඟ ම තම ලෝගුව මඳක් විවර කළ ඇය ඇතුල් කබායේ වූ පොලිස් හැඳුනුම්පත මුරකරුට පෙන්නුවා ය.

"කෙයිලා පොලිසියෙන්"

මුරකරු කිසිවක් කීවේ නැත. ඔහු තමා ඉදිරියේ හිටගෙන සිටින සද්දන්ත කාන්තාවට දොර විවර කර දී පසෙකට විය. සුවී ගොඩනැගිල්ල තුළට ඇතුළු විය. එයට ඇතුල්වත් ම එයින් ආයේ මාංශවල නැවුම් සුවඳකි. එම සුවඳට නහය ඔසවා හොඳ හුස්මක් ගත් සුවී අඩි දෙක තුනක් ඉදිරියට ගොස් එහි ඉදිරිපස ම මේසයේ සිටි කාන්තාවට කතා කළා ය.

"කෝ කවුද මේක පාලනය කරන්නේ?"

සුවීගේ කටහඬින් කාන්තාව තැති ගන්නට ඇත. ඇයගේ පොලිස් හිස්

වැසුමත්, විශාල ශරීරයත්, ඉදිරියට නෙරා විත් තිබුණු කුස දෙසත් බැලූ කාන්තාව එතැන ම දකුණු පස වූ කාමරයට ඇඟිල්ල දික් කළෙන් සුවී එම කාමරයට ගොස් තට්ටුවක් දැමුවා ය.

"එන්න" ඇතුළතින් ඇසිණි.

ඇය දොර විවර කොට ගෙන ඇතුළට ගියා ය. එහි සිටියේ තට්ට හිසක් ඇති, රවුම් උපැස් යුවළක් පැලඳ සිටි තරමක් වයසැති පිරිමියෙකි. ඇය ඔහුට අතට අත දී ආචාර කළා ය.

"සුවී සෙප්පේ, කෙයිලා පොලිසියෙන්"

"ඉඳගන්න නෝනා" ඔහු ද ආචාරශීලී ව කීවෙන් කාමරය දෙස වට කිහිපයක් බැලූ සුවී එතැන වූ පුටුවෙහි ඉඳගත්තා ය. එසේ ඉඳගත් විට ම ඇය කිසිම පැකිළීමකින් තොරව ඇයගේ අතේ තිබුණු මස් බෑග් දෙක ඔහු ඉදිරියේ තැබීය.

"තමුන් මේ ආයතනයේ කවුද?"

"මම තමයි මේකේ කළමනාකරු"

"එතකොට කෝ මේකේ අයිතිකාරයා?"

"ඔහු ටාලීන්වල" කී තැනැත්තා ඔහුගේ ටයි පටියත් හරිගස්සමින් සූවී අසලට නැඹුරු විය.

"ඇයි නෝනා මොකක්ද ප්‍රශ්නේ?"

ඔහුගේ කටහඬේ ඇත්තේ ගැඹුරු සංවරකමකි. එහෙත් එම සංවරකම සුවී ඊළඟට පැවසූ වචන කිහිපය නිසා එක්වර ම තැති ගැන්මක් බවට පත්විය.

"අපිට සිද්ද වෙනවා මේ ආයතනයට සම්පූර්ණයෙන් ම මුද්‍රා තබන්න"

"මොනවා, ඇයි අපි මොන වරදක් කරාට ද?"

"වරද? මේක නිකන් වරදක් නෙමෙයි, බරපතල වැරැද්දක්. කොටින්ම මේකට හවුල් වුණ හැමෝම හිරේ විලංගුවේ වැටෙන්න තරම් බරපතල වැරැද්දක්. තමුන්ටත් තමුන්ගේ ලොක්කටත් දෙන්නට ම" සුවී කීයෙන් ඔහු තවත් බියට පත් විය.

"මොනවද ඔය නෝනා මේ කියන්නේ?" ඔහු එම භීතියත් සඟවාගෙන විමසීය.

"මේ මස් කඩය පටන් අරන් අවුරුදු කීයක් ද?"

"අවුරුදු පහක් විතර"

"එතකොට මිනිස් මස් අඹරන්න පටන් අරන් කොච්චර කල් ද?"

"මොකක්?" සුවී ඉදිරියේ සිටි මිනිසා ව එක්වර ම ඔහුගේ ආසනයෙන් හිටවුණි.

"මිනී මස් අඹරන්න අරගෙන කොච්චර කල් ද?" සුවී එම ප්‍රශ්නය උස් හඬකින් යළිත් ප්‍රතිරාව කළා ය.

"නෝනා මේ ආයතනය ප්‍රමිතියකට අනුව වැඩ කරන එකක්"

ඔහු එසේ කියත් ම මේසය මත තැබූ බෑගය සුවී ඔහුගේ මුහුණ ඉදිරියට කොට ඇල්ලුවා ය.

"මිනිස් ඇඟිල්ලක්, තමුසෙලාගේ මස් එක්ක හම්බවෙලා තියෙන්නේ"

"මොනවා" ඔහු එම බෑගය ඇල්ලීමට උත්සහ කළත් සුවී එයට අවසර දුන්නේ නැත. ඇය එය ඔහුගේ දෑසට ළංකොට, ඔහු 'ඇඟිල්ල නිශ්චිත ව දැක්කා යැයි' ප්‍රත්‍යක්ෂ වූ පසුව යළිත් මේසය මතින් ම තැබීය.

"මම කිවුවා වගේ ම මේක දරුණු ප්‍රශ්නයක්, මේක එළියට ගියොත් තමුන්ගේ ව්‍යාපාරය එහෙම් පිටින් ම වැහිලා යනවා විතරක් නෙමෙයි, මිනිස්සුන්ගෙනුත් හොඳට ගුටිකන්න සිද්ද වෙයි. තමුන් දන්නවනේ මිනිස්සුන්ට මිනි මස් කැවුවා කියලා ආරංචි වුණොත් ඒ මිනිස්සු මේකට මොනවා කරයි ද? සමහර විට මේකේ වැඩ කරන අයත් එක්ක ම මේ ගොඩනැගිල්ලත් ගිනි තියලා දායි" කී ඇය ඔහුට යළිත් පුටුවෙන් ඉඳගන්නැ'යි අතින් සං කළෙන් නිලධාරියා බියෙන් සහ අසරණකමින් තැති ගනිමින් පුටුවෙන් ඉඳගත්තේ ය.

"නෝනා එක්කෝ මේක වැරදීමක්... එහෙම නැත්නම් දෙයියන්පා, කාගේ හරි කුමන්ත්‍රණයක්"

"නැහැ... මේක තමුන්ගේ මස් කඩයෙන් ම කෙයිලාවලට ආපු එකක්... අපිට ඒකට සාක්ෂි තියෙනවා. මට හෙට වුණත් උසාවි නියෝගයක් අරගෙන මේ ගොඩනැගිල්ලට මුද්‍රා තියන්න පුළුවන්"

"අනේ නැහැ නෝනා" කළමනාකරු බයාදු විය.

"හරි... ඒක අපි පස්සේ කරමු. මට දැන් මේ කර්මාන්තශාලාවේ හැමදෙයක් ම පරීක්ෂා කරන්න ඕනේ" ඇය තම ආසනයෙන් නැඟී සිටිමින් කීවා ය.

ෂ

ටාලීන් හි පොලිස් නිලධාරියාට ගත් ඇමතුමෙන් පසුව ඔහු විසින් යෙරාජ්ගේ ඊමේලයට ලුතිනා නොයාල් නම් තරුණියගේ අතුරුදහන් වීම සම්බන්ධ පොලිස් වාර්තා සියල්ල ම පාහේ එවා තිබුණෙන් යෙරාජ් ඒවා එකිනෙක පරීක්ෂා කරන්නට පටන් ගත්තේ ය. එම වාර්තාවලට අනුව ඇය අතුරුදහන් වී ඇත්තේ මීට මාස තුනකට පෙර අගෝස්තු මස එකොළොස් වන දින වූ අතර ඒ වන විට ඈ ටාලීන් හි රැකියාවක නිරත වෙමින් සිටියා ය. ඇයගේ මව සහ පියා දෙදෙනා ම ග්‍රීක ජාතිකයින් බවත් ඔවුන් බොහෝ කාලෙකට පෙර එස්ටෝනියාවට විත් පදිංචි වී ඇති බවත්, ලුතීනා ඉපදී ඇත්තේ ද එස්ටෝනියාවේ බවත් එහි සඳහන් ය. යෙරාජ් එම වාර්තා පෙරළමින් තම පරීක්ෂණයට වාසියක් වන කිසියම් හෝ දෙයක් ඇත්දැයි විමසිල්ලෙන් බැලුවේ ය. වාර්තා සියල්ල ම දෙතුන් වරක් කියවූ පසුවත් එහි පරීක්ෂණයට වැදගත් වන යමක් නොදැක්කෙන් ඔහු තම උපැස් යුවළ මේසය මතින් තබා පුටුවට හොඳින් බර විය.

මෙහි සඳහන් වන ආකාරයට තරුණිය අගෝස්තු මස එකළොස් වන දින උදෑසන රාජකාරියට ගොස් යළිත් නිවසට පැමිණ නැත. ඇය මිතුරකුගේ නිවසට යන්නට ඇතැ'යි සිතූ දෙමව්පියන් ඈ එනතුරු ඊළඟ දිනයේත් බලා සිට ඇති අතර, එහෙත් ඈ නොපැමිණි තැන ඇයගේ සමීපතම මිතුරියන් කිහිප දෙනකු සමඟත් කතා කොට මෙම සිදුවීම පිළිබඳව පොලිසියට පැමිණිලි කොට ඇත. පොලීසිය එතැන් සිට තම රාජකාරිය ආරම්භ කොට ඇතත් මෙතෙක් ඇය ගැන කිසිදු හෝඩුවාවක් සොයා ගැනීමට ඔවුනට හැකිවී නැත. යෙරාජ් ඒ සියල්ල ම කල්පනා කරමින් අවසානයේ දී තම මේසය මත ඇති රස පරීක්ෂකයින් විසින් එවූ වාර්තාව දෙස බැලුවේ ය.

ඇය ගැන හෝඩුවාවකට ඇත්තේ මේ වාර්තාව පමණි. එහෙත් මෙහි සඳහන් වන ආකාරයට කපා වෙන් කළ අත මහලු කාන්තාවකගේ අතකි. එසේ නම් ඒ මහලු කාන්තාවගේ අත බහා තිබුණු පොලිතින් උරයට තරුණියගේ රුධිරය කලවම් වුණේ කෙසේද? ඈ අතුරුදහන් වූ පසුව ඇයට කුමක් සිදුවන්නට ඇත් ද? මේ මහලු කාන්තාවත් ඇයත් අතර ඇති සම්බන්ධය කුමක්ද?

යෙරාජ් ඕජා මේ සියල්ල ගැන ම සිතමින් දෑස් ඉහළට ඔසවාගෙන කල්පනා කරන්නට පටන් ගත්තේ ය.

෧෯

සුවී, කළමනාකාර තැන සමඟ කර්මාන්තශාලාවේ ඇවිද යන්නට පටන් ගත්තා ය. ප්‍රධාන ශාලාවේ ඇති කාර්යාල දෙක තුන පසු කළ පසුව එය විවර වන්නේ ඊටත් වඩා පස් ගුණයකින් පමණ විශාල ශාලාවකට ය. දොර විවර කොට එයට ඇතුල් වෙත් ම එයින් ආ යන්ත්‍ර ක්‍රියා කරන හඬින් සුවී එතැන ම හිට ගත්තා ය. ඇයගේ අත තම කුසට යා විය.

"පිපී ඔයා අකමැති වෙයි මේ සද්දෙට, ඒත් මට මේක බලන්න ම ඕන, ටික වෙලාවක් ඉන්න" සෙමෙන් මිමුනු ඇය කළමනාකරු සමඟ එතුළට පියවර තැබුවා ය.

එහි ඉදිරියෙන් ම හරක් මස් කුට්ටි එක දිගට එල්ලූ දිගු බාල්ක පේළියක් ඇත. බාල්කවල ඇති හරක් මස් කුට්ටි එක පේළියට ඒවා කැබැලි කිරීමේ යන්ත්‍රය වෙත ඇදී යයි.

එම යන්ත්‍රය දිගේ කොකු අතින් ගත් සේවකයන් කිහිප දෙනෙකි. ඔවුහු මස් කඳන් බාල්කවලට එල්ලති. තවත් අය ඒවා නිවැරදිව යන්ත්‍රය කරා යන්නේ දැයි බලමින් ඒවා හසුරවමින් සිටිති. තවත් කිහිප දෙනක් යන්ත්‍රය පිටුපස ම කොටසේ වූ විශාල මස් අඹරන යන්ත්‍රය අසල හිටගෙන සිටිති.

තව තවත් කර්මාන්තශාලාව ඇතුළට යත් ම යන්ත්‍රවල හඬ ද දැඩි වූයෙන් සුවීට එය දරාගෙන සිටීමට හැකි වූයේ නැත. ඇයගේ දෑස් කර්මාන්තශාලාව දෙපසේ වූ අනෙකුත් කාමරවලට යොමු විය.

"අර කාමරවල මොනවද තියෙන්නේ? ඇය ඇසුවා ය.

"ඒවා මස් ඇසුරුම් කාමර, අර පිටිපස්සෙ ම තියෙන්නේ කුඩා ඇඹැරුම් යන්ත්‍ර සවි කරලා තියෙන කාමර කිහිපයක්. මෙතැනින් ගන්න මස් අපි තවත් කුඩා කරන්නේ ඒ යන්ත්‍රවලින්"

ඔහු කීවෙන් සුවී යන්ත්‍රවල හඬ නොඇසෙන තැනක් සොයා ඉක්මන් ගමනින් පාද තැබුවා ය. කළමනාකරුත් ඈ පිටුපසින් යන්නට විය.

එම කුඩා කාමරයත් පසුකරමින් කර්මාන්තශාලාවේ පිටුපස ඇති පිටවීමේ දොරටුව අසලට ආ සුවී එතැනින් පිටතට පැමිණියා ය. කර්මාන්තශාලාවෙන් පිටතට ආ නිසාවෙන් ඇයට දැනුණේ පහසුවකි. ඈ එක් අතකින් කුසත් අල්වාගෙන පිටුපස දොරටුව අසල දී පෙනෙන අතුරු මාර්ගය දෙසත්, යාබද වූ මුරකුටිය දෙසත් බැල්මක් හෙළී ය. මෙය ගොඩනැගිල්ලට පිටුපසින් දිවෙන අතුරු පාරකි. සේවකයින් ප්‍රධාන මාවත හරහා සේ ම මෙම අතුරු මාර්ග